භක්ති ප්‍රබෝධනය
පවුලේ සඟරාව

# භක්ති ප්‍රබෝධනය

2020 පෙබරවාරි

සියවසක් ඉක්මවූ නොනවතින යුග මෙහෙවර

2020 පෙබරවාරි | 121 වන කාණ්ඩය - 02 කලාපය | පිටු 32 | Q/D/03/පුවත්/2020



## නිදහස වගකීමකි

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල සඟරාව

ආරම්භය 1899

මිල රු.35/=
(සහන මිල)

# රහසක් පවසමි

**ගේය පද - චන්ද්‍ර කීර්ති කුලරත්න**
**සංගීතය සහ ගායනය - අයිවෝ ඩෙනිස්**

පුන ගැයුම

රහසක් පවසමි පුතුනෙ අසනු මැන - හදවත සවන යොමා
දහසක් එක්කර පවසනු මැන එය - තව තව නොවී පමා

නොහැක නොමැත යයි බැරි යයි පවසා - සිටින යමෙකු පොළොවේ
පොළොවට බරවී සිටිනු විනා නැත - දිනුමක් ඔහු දුටුවේ
තම පුළුවන් කම හැකිකම ඇතිකම - දිරිදී නිරන්තරේ
බාධක බිඳගෙන ආවිට ඇරඹෙයි - දියුණුවේ කතන්දරේ

රහසක් පවසමි.................

හිත හිත බල බල තැවි තැවි ඉදිතොත් - පමාව වැඩිය හෙළේ
සිත කය වෙහෙසා නිමවනු නිපැයුම් - ඔබ සම්පතකි හෙළේ
ගොඩට මඩට වුව පෑන උදැල්ලට - හිතදී එක සෙ හෙළේ
පිරුණු අනාගත වීරිය දරනට වර විරු - පුතුනෙ හෙළේ

රහසක් පවසමි.................

යුතුකම යුක්තිය අයිතිය ඉල්ලා - හඬක් නගන විටදී
ඔබ ළඟ යුතුකම යුක්තිය ඇත්දැයි - බලනු මැනවි සිතදී
අවැඩෙන් අවැඩක් මිස නැත කිසිදා - වැඩක් සෙතක් වන්නේ
පළමු මගේ රට දෙවනුව මා යයි - සිතවු සිතවු පුතුනේ

රහසක් පවසමි.................

නිද්‍රාබරිත ජාතියකට උදාන ගීයක් දැන්නම් අවැසිමය. - ජාතිවාදී නොවූ - ගෝත්‍රවාදී නොවූ, ආගම්වාදී නොවූ, කුලවාදී නොවු උදාන ගීයක් අවැසිමය. ස්වාර්ථය නොව පරාර්ථය ප්‍රමුඛ මානවවාදී, ආධ්‍යාත්මික දේශයකට අවදිවන්නට කාලය උදා වී ඇත. දකිනු කැමති වෙනස පිටත නොසොයන්නටත් සෙයකි. දකිනු කැමති වෙනස තමාම වන්නටත් කාලය එළඹ ඇත.

ස්වකීය බලයම ස්ථාපිත කරගනු වස්, විභේදිත රටක් බිහි කළ, දේශපාලන, කුමන්ත්‍රණකාරී ස්වරූපයත් - ස්වකීය ලෞකික පැවැත්ම සාක්ෂාත් කරගනු වස් විභේදිත මනස් බිහිකළ, සංස්ථාපිත කුමන්ත්‍රණකාරී - ආගමික ස්වරූපයත් - ස්වකීය ධන උල්පත් සුරක්ෂාකරනුවස්, බිහිකළ භාණ්ඩ මූලික භෞතික වෙළද පොල කුමන්ත්‍රණකාරී ස්වරූපයත් - අවබෝධයෙන් දැකීමට කාලය උදාවී ඇති සෙයකි.

මේ එවන් මානසික නැවත උපදීමකට උත්තේජනය සපයන වත්මන් උදාන ගීයයි - උපදේශාත්මක ගී කවි, අභාෂයෙන්ද, දේශානුරාගී ගී කවි ආකෘතිත රසෝත්පත්තියෙන්ද, උපන් හුදෙකලා විඥාන පුළුල් කරමින්, මහා ජන විඥානය පුළුල් කරනු වස් දිරිගන්වන ජව සපයන අපේ කාලයේ උදාන ගීතයයි මේ...........

**සංජය නිර්මාල්**

# ශක්ති ප්‍රබෝධනය

2020 පෙබරවාරි කලාපය


**ප්‍රකාශනය**

නිර්මල මරිය නිකාය

**භාරකරු**

අති ගරු අර්වින් එච්. මොරායස් නි.ම.නි. පියතුමා
නිර්මල මරිය නිකායික කොළඹ ප්‍රාදේශාධිපති
කොළඹ ප්‍රාදේශිකය

**සංස්කාරක**

ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා

**සහාය සංස්කාරක**

රූපස් ප්‍රැන්සිස්
ටී. සුනිල් ප්‍රනාන්දු
ෆිලීෂන් අබයකෝන්

**කාර්යාලයීය සහාය**

දිනේෂා රණවක

**මුද්‍රණ සැලසුම හා කවර නිර්මාණය**

සිසිර විජේතුංග ග්‍රැෆික්ස්

**මුද්‍රණය**

කතෝලික මුද්‍රණාලය
කොළඹ 08


## පිටුවෙන් පිටුව.........


2 කවරයේ කථාව

3 හෙළිදරව්ව

4 නිදහස පිළිබඳ දෙව්දමින් හෙළිවන අදහසක්......
- ගරු කෝකිල විජයවික්‍රම පැ.තු.නි. පියතුමා

7 නිදහස වගකීමකි - ෆිලීෂන් අබයකෝන්

8 ඇත්තෙන්ම නිදහස්ද අපි? - සචිත මෙන්ඩිස්

9 ඒවූ නිදහසේ ස්වර්ග රාජ්‍යයට
මාගේ දේශය අවදි කරනු මැන
- තරංගනී රෙසිකා කුමාරි ප්‍රනාන්දු

11 බැලන්ස් කර ගැනීම
- ගරු දිනේෂ් කීර්තිසිංහ පියතුමා

12 නිදහසට වහල් වී - කුමාරි පෙරේරා

12 නිදහසක් නැති නිදහසක්
- ලූෂන් එඩ්වඩ් පෙරේරා

13 නිදහස නව මානයකින්
- ජේ.ඒ.ඩී. රෝහිණී ජයසිංහ

14 නිදහස සහ වගකීම - අචල රූපසිංහ

14 අම්මා - රුචිර අශාන් පෙරේරා

15 උදුරාගත නොහැකි නිදහස - වි.ලෙ. පීරිස්

17 රටත් නිදහස්, ගමත් නිදහස් ඒත්....
ඔබ, මම නිදහස් ද? - බුද්ධික සඳරුවන්

18 පුංචි විකුම් - සූරිය මාමා

19 ප්‍රහේලිකා අංක 57
- ගරු ලක්මාලි ප්‍රනාන්දු පැවිදි සොහොයුරිය ශු.ප.

20 සැබෑ සිත් හැරීමක් තුළ ශුද්ධවන්ත දිවියක්
ගත කළ ශු. පෙරිග්‍රීනු මුනිතුමා
- ගරු ලක්මාලි ප්‍රනාන්දු පැවිදි සොහොයුරිය ශු.ප.

21 මළ මුහුද සහ සොදොම් ගොමෝරා
- කැලිස්ටස් ජයමාන්න

22 "ඈ"- ඩබ්.ඩී. මැටිල්ඩා අධිකාරම්

23 අපි ඔක්කොම රජවරු
ඔක්කොම වැසියෝ තුන් සිංහලයම......?
- මංගල ජයවර්ධන

24 වපුරන්නෙක් වපුරන්නට ගියේය
- ගරු සාර්ටෝ නෝනිස් පියතුමා

26 ඕං එහෙනං - සූරිය මාමා

27 "දහම් අරුණෝදයක් කරා"
- ජෝ. සංගපාල ආරච්චි

28 නිදහසේ සැබෑ ඇරුත සොයා යන්නට......
- නීටා අයි. ප්‍රනාන්දු

29 කතෝලික ධර්මය, අ.පො.ස (සා/පෙළ)
ආදර්ශ ප්‍රශ්න පත්‍රය - 2020
- ජේ.ඒ.එල්.එම්. ශ්‍රිමතී සිල්වා මෙනවිය

31 ලක්දිව ක්‍රිස්තු ශාසනය (VII) / අ.පො.ස. (උ.පෙ.)
ක්‍රිස්තියානි ධර්මය - ශිෂ්ටාචාරය සඳහා අත්වැලකි
- එස්. හේමාල් පෙරේරා

වසර 1899 සිට අඛන්ඩව
එළිදක්වන භක්ති ප්‍රබෝධනය
ශ්‍රී ලංකාවේ පළවන
ඉපැරණිම සිංහල සඟරාවයි.
භක්ති ප්‍රබෝධනය
නිර්මල මරිය නිකායේ
කොළඹ ප්‍රාදේශිකයේ
භාරකාරත්වය යටතේ
පළවන ප්‍රකාශනයකි.
(නි.ම.නි.)

Bhakthi Prabodhanaya,
Published continuously
since 1899, is the oldest
Sinhala magazine in Sri Lanka.
Bhakthi Prabodhanaya,
is owned and published by
the Colombo Province of the
Oblates of Mary Immaculate.
(O.M.I.)




## කවරයේ කථාව

හැම මොහොතකම තීරණයකට මනුෂ්‍ය අපි සූදානම් වෙමු. මනුෂ්‍යයාට ඇති නිදහස අපමණය. ඒ නිදහස පෙරදැරි කරගෙන තමන් ඇතිකර ගන්නත්, නැතිකර ගන්නත් කෙනකුට නිදහස සහ වගකීම ඇත. අනිත් අය නැති කරන්නත්, ඇති කරන්නත් තමන්ට අවස්ථා ඇත. මේ සියල්ල මිනිස් නිදහසේ ස්වභාවයයි. කුරුල්ලාගේ ජීවිතය මනුෂ්‍ය දෑතේය. ඌට නිදහස දී කැලයට මුදා හරින්නට හෝ කූඩුවක දා හදන්නට හෝ විනාශ කරන්නට හෝ කවරයේ පෙන්වන මනුෂ්‍ය දෙඅතට අවස්ථා කිහිපයක් විවෘතය. මනුෂ්‍ය අතේ ඇති නිදහස, වගකීම යන්න කවරයේ කථාව අවධාරණය කරයි.

## භක්ති ප්‍රබෝධනය

**දායකත්වය එක් වසරකට - රු.500.00**
(මුද්දර ගාස්තුව ද ඇතුළත්ව)

**දායකත්වය සය මසකට - රු.250.00**
(මුද්දර ගාස්තුව ද ඇතුළත්ව)

සියලුම ලිපි, දායකත්ව මුදල් හා විමසීම් මේ ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක පියතුමා.
**භක්ති ප්‍රබෝධනය**
265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.
දූරකතන : 011 2698177
විද්‍යුත් තැපැල (ඊමේල්) :
bprabodanaya@gmail.com

## BHAKTHI PRABODHANAYA

**Local Subscription Rate.**

**Rs. 500.00 per year** (Including Postage)

**Rs. 250.00 per SIx months**
(Including Postage)

Letters, subscriptions and inquires should be addressed to:

Editor.
**"Bhakthi Prabodhanaya"**
265, Deans Road, Maradana,
Colombo 10, Sri Lanka.
Tel.: (94) 011-2698177
Email: bprabodanaya@gmail.com

## හෙළිදරව්ව

# නිදහසේ ඉලක්ක කරා.....?

මුදලට ගන්න බැරි දෙවියන් වහන්සේ මනුෂ්‍යයාට දුන් මහා වටිනා සම්පත නිදහසය. දෙවියන් වහන්සේ මනුෂ්‍යයාට ලබා දුන් නිදහස වෙන කිසිම ජීවිතයකට ලබා නුදුන් සේක. එහෙත් මනුෂ්‍යයාට වුවද නිදහස කිසියම් සීමාවකට උන්වහන්සේ යටත් කළ සේක. "දෙවියන් වහන්සේ මිනිසාට අණ කරමින් **"උයනේ සියලුම ගස් වලින් ගෙඩි කෑමට නුඹට නිදහස ඇත. එහෙත්, හොඳ නරක අවබෝධ කිරීමේ ගසින් පමණක් නොකෑ යුතුය. නුඹ යම් දවසක ඒ ගසින් කන්නෙහිද ඒ දවසෙහි මරණය නුඹට ඒකාන්ත යයි වදාළ සේක" (උත්පත්ති 2:16-17).** හොඳට හෝ නොහොඳට, හරියට හෝ වැරදියට, යහපතට හෝ අයහපතට නිදහස භාවිත කිරීමට ලැබුණු වරම මනුෂ්‍යයාට ලැබූ නිදහසේ උරුමයයි. එහෙත් නිදහස වනාහි කාසියක දෙපැත්තට සමාන කළ හැකිය. නිදහස ලැබුණු වහා ඒ හා සමග ඔහු හෝ ඇය වගවීමට බැඳෙයි. තමන් කැමති දෙයක, කැමති වේලාවක, කැමති තැනක, කැමති ඉරියව්වක සිටින්නට පිළිවන් යැයි සිතීම මායාවකි. එලෙස කරන්නා තමනට ලැබුණු නිදහස අපයෝජනය කරයි. එවන් අය නන්නත්තාර වන්නේ අනිත් අයවද සංකීර්ණ ප්‍රශ්න ගණනාවකට ඇද දමමින්ය. එවැනි වල් බූරු නිදහසක් භුක්ති විඳින්නෝ සමාජයේ බොහෝ දෙනකුගේ නිදහසට බාධා කරති. සැබෑ නිදහස නිසි අයුරින් භුක්ති විඳින්නට පුද්ගලයා පරිණත විය යුතුය. අන් අයගේ අදහස් වලට, ක්‍රියාවලට, සංවේදී විය යුතුය. හැම පුද්ගලයකුටම අභිමානවත් ජීවිතයක් ගත කරන්නට තිබෙන අයිතිය අවබෝධ කරගත යුතුය. අනිකාට ගරු කළ යුතුය. තමාගේ නිදහස නිසා තවත් අයගේ නිදහස අහුරා නොදමන්නට වග බලා ගත යුතුය.

මේ කාලයේ දේශපාලන නිදහස, ආර්ථික නිදහස, සමාජීය නිදහස ගැන අපි කථා කරමු. කියන්න, ලියන්න, කෙටි පණිවුඩ යවන්න, මාධ්‍ය නිදහස, තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය කතාබහ කරති. එහෙම කථා කරන සමාජයක පසුගිය ජනාධිපතිවරණයෙන් පසු මීගමුවේ වේදනාවට පත්වූ ජනතාවට ඇතැමුන් සමාජ වෙබ් අඩවි හරහා මුදාහළ ඇතැම් මත මොනතරම් සදාචාරාත්මකද? කොතරම් පහසුවෙන් අන් අයගේ නිදහස අපයෝජනයට ලක් කළාද? තමන් අදහන දහමට හෝ දර්ශනයට එය කොතරම් දුරට ගලපා ගත හැකිද? යන්න ස්වයංවිවේචනයක් කර ගැනීමකින් තොරව නිදහස් දින ගැන කථා කිරීම එහි සැබෑ අරුතට සාධාරණයක් ඉෂ්ට නොවේ. තමන්ගේ මතයට විරුද්ධ වන අයට නිගරු කිරීම, හෙළා දැකීම, පහර ගැසීම, චරිත ඝාතනය කිරීම මොනතරම් පිළිකුල් සහගතද?

තමන් සාධාරණ නොවී, අන් අයගෙන් සාධාරණත්වය බලාපොරොත්තු වීමත්, තමන්ගේ යුතුකම් හා වගකීම ඉෂ්ට නොකොට කීදෙනකු අද අන් අයගෙන් ඒවා බලාපොරොත්තු වන්නේද? යන කරුණු හාස්‍යයට කරුණකි.

**"යුතුකම යුක්තිය අයිතිය ඉල්ලා හඬක් නගන විටදී - ඔබ ළඟ යුතුකම යුක්තිය ඇත්දැයි බලනු මැනවි සිතදී"**

චන්ද්‍ර කීර්ති කුලරත්න රචිත "රහසක් පවසමි පුතුනි අසනු මැන" මේ ගීතයේ එන මෙවදන් මෙවන් කාලයකට කොතරම් කාලෝචිතද? වසර හැත්තෑ දෙකක දේශපාලන නිදහසක් කථා කරන පෙබරවාරි හතරවන දා සැබෑ නිදහසේ අරුණලු යථාර්ථවාදීව කල්පනා කිරීමකින් තොරව, අප විසින් ලබා ගත යුතු සැබෑ අභිමානවත් **නිදහසේ** භූමිකාවේ **ඉලක්කය කරා** ළඟා වීමට දරන ප්‍රයත්නය මායාවක් නොවන්නේද?

# නිදහස පිළිබඳ දෙව්දමින් හෙළිවන අදහසක්....

**හැඳින්වීම.**

"අයෙකුගේ නිදහසේ සීමාව තවකෙකුගේ නාසය ළඟින් අහවර වේ". මෙම සමාජ වහර තුළ නිදහස යන අදහස ගැඹුරින් අර්ථ නිරූපණය වන බවක් මට හැඟේ. නිදහස හා සබැඳි වගකීම ද එමගින් මනාව පිළිබිඹු වේ. සිතීම, හැසිරීම ඇතුළු පුද්ගල පැවැත්මට අයෙකු සතු හැකියාවේ වපසරිය එම පුද්ගලයාගේ නිදහස ලෙස තේරුම් ගත හැක. එමෙන්ම, නිදහස අරඹයා වන දාර්ශනික කියවීම තුළ පුද්ගල නිදහස යනු සදාචාරාත්මක වගකීමෙන් (Moral Responsibility) සමබර වන පුද්ගලයකුගේ නිදහස් කැමැත්තයි (Free will). පුද්ගල තෝරාගැනීම හා තීරණ ගැනීම සිදුවන්නේත් පුද්ගලයකුගේ නිදහස් කැමැත්ත තුළයි. ඒ අනුව පුද්ගලයකුගේ සමස්ථ පෞරුෂායම එම පුද්ගලයාගේ නිදහස් කැමැත්තට අනුකූළ වේ. එම නිසාම, වගකීමෙන් තොර නිදහස වල්බූරු නිදහසක්ම වන්නේය. එලෙසම, නිදහසෙන් තොර වගකීමක් ගැන ද වගකීමෙන් තොර නිදහසක් ගැන ද අපට සිතාගත නොහේ.

මුල් මානව පවුල වන ආදම් හා ඒව විසින් ස්වකීය නිදහස් කැමැත්ත අවභාවිතා කිරීම හේතුවෙන් උද්ගත වූයේ පරම්පරාගත පටලැවිල්ලකි. තහනම් ගහෙන් ගෙඩි කන්නට පෙර ආදම්, ඒව දෙදෙනාම අවිහිංසක දේව දරුකම හෙවත් පාපය නොදත් දේව දරුකම දරාගත්තෝය. මෙය ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ තිබූ ස්වභාවයයි. **"දෙවියන් වහන්සේ පාපය නොදත් ක්‍රිස්තුන් වහන්සේ අප උදෙසා මනුෂ්‍ය පාපී බව හා සමවීමට සැලසූ සේක" (2 කොරින්ති 5 : 21).**

**දෙවිඳාණන් මැවූ සියල්ල යහපත් විය. එම නිසාම ආදී මව්පියන්ගේ වැටීමට පෙර අයහපත දැනගැනීමට මඟක් කිසිසේත්ම නොවීය. ඔවුන් විසින් තහනම් ගහේ ගෙඩි කෑමෙන් පෙන්වන ලද්දේ නපුර එසේත් නැතිනම් අයහපත දැනගැනීමට ඔවුන් තුළ තිබූ කැමැත්තයි. දේවල් අයහපත් ලෙස දැකීමේ බලයට වන කැමැත්තයි. මේ බලය ආරෝපණය කරගත් ආදම් සහ ඒව මුලින්ම දුටුවේ තමන්ගේ අයහපත් බවයි. ඒ නිසා ඔවුන් විසින් සැඟව සිටීමට අදහස් කළෝය. තහනම් ගහේ අත්දැකීමට පෙර ගස රමණීය විය, එළ ප්‍රණීත විය, යහපත් විය (උත් 3 : 6).** තහනම් ගහේ අත්දැකීමට පසු එම ගසම නරක, වැරදි, නපුරු ගසක් ලෙස ඔවුන්ට පෙණුනි. ආදම් ප්‍රථම වතාවට භෞතික නොවන දේ අත්දකින්නට හා ඒවා නම් කරන්නට පෙළඹිණි. නිර්වස්ත්‍ර භාවය, ලැජ්ජාව බවට පත්විය. හිතේ තැතිගැනීම භය හා වේදනාව බවට පත්විණි. වැටීමට පෙර ඔහු විසින් නම් කරන ලද්දේ ඇසට පෙණෙන, කනට ඇහෙන අතින් ඇල්ලිය හැකි දේ පමණි (උත් 2 : 20).

**මෙයින් පෙනී යන්නේ අයහපත හා ගණුදෙනු කිරීමට ආදම් හා ඒව තුළ වූ බලවත් කැමැත්තයි.** මෙම නිදහස තෝරාගැනීමට දෙවියන් වහන්සේ ගරු කළ සේක. ඉන්පසු පාරාදීසයේ අත්දැකීම ඔවුන්ට තවත් නොවීය. අයහපත දැනගැනීමෙන් ඇසුරු කිරීමෙන් ආදම් හා ඒවගේ කැමැත්තට දෙවියන් වහන්සේ ඉඩ හැරිය සේක. **ප්‍රතිඵලය වූයේ වෙහෙස, මහන්සිය, දුක හා වැඩපළත් සමඟ මිශ්‍ර වීමයි. සබඳකම්, වේදනාව හා ඊර්ෂ්‍යාව සමඟ මුසු වීමයි. යහපත් සැමදේ අයහපත් සැම දෙය සමඟ සම්මිශ්‍ර වීමයි.** ඔවුන්ගේ නිදහස් කැමැත්ත තුළ ඔවුන් ඉල්ලූ, සෙවූ, ඔවුන් පැතූ දේ ඔවුන්ට අවසානයේදී ලැබුණි.

දෙවියන් වහන්සේ විසින් අපගේ සැම ජීවිත සිද්ධියකදීම තෝරා ගැනීමේ අවස්ථාව අපට දී ඇත. අයහපත හෝ යහපත ද, වැරදි දේ හෝ නිවැරදි දේ ද, තමන් හෝ අනෙකා ද තෝරාගැනීම් හැකියාව අපට ලැබී ඇත. නමුත් මානව වර්ගයා තුළ ඇත්තේ නෛසර්ගික (Inherent) අයහපතයි. හැඬීම, කුඩා දරුවන් අනෙකාට ගැසීම, හා සැපීම ඔවුන්හට කා විසින්වත් ඉගැන්වූ දෑ නොවේ.

දෙවිඳාණන් විසින් නිදහස් කැමැත්ත අපට නොදී නෛසර්ගික යහපත සමඟ අප මැවූසේක් නම් කොතරම් යහපත් දැයි කෙනකුට සිතීමට පුළුවනි. නමුත් දෙවියන් වහන්සේ මිනිසාව මැවුවේ තමන්ට සැබැවින්ම ආදරය කරනවුන් සමඟ සදාතනික ජීවිතය බෙදාගැනීම සඳහායි. සැබෑ ආදරය පැන නගින්නේ ස්වඅභිමතය තුළින් පමණකි. සැබෑ ආදරය තෝරා ගැනීමක ප්‍රතිඵලයකි. මෙතෙක් අප කතා කළ දෙය කැටිකොට පාවුලු තුමා මෙසේ දක්වයි. “**මා කැමැති දෙයක් කිරීමට මට නිදහස ඇතැයි කීවත් හැමදේම මගේ යහපත පිණිස නොවේ. එසේම කැමැති දෙයක් කිරීමට මට නිදහස ඇතැයි කීවත් මම කිසිවකට වසඟ නොවෙමි**” (1 කොරින්ති 6 : 12). “**සහෝදරවරුනි, ඔබ නිදහස්කමට කැඳවනු ලැබූවාහුය. ඔබගේම නිදහස මානසික තෘෂ්ණා සඳහා වැය නොකොට ප්‍රේමයෙන් එකිනෙකාට සේවය කරන්න**” (ගලාති 5 : 13).

සුබාරංචිය අදහන සැබෑ කිතුනුවකුගේ සැබෑ ලක්ෂණයක් වනුයේ ඔහු අත්දකින නිදහසයි. එය දයාධික මනස්ථාපනයෙන් පැන නැගුන්නකි. අනෙක් අතට, දෙවිඳුන් හුදෙක් සතුටු කිරීම සඳහා පමණක් දෙව්පනත් සුරැකීම අප විසින් නොකළ යුතු කාරණාවක් බව අප වටහා ගත යුතුය. දේව වරප්‍රසාදය අප වෙත ගලා එන්නේ දෙවියන් වහන්සේගේ සිතුවිලිවලට අපගේ හැසිරීම එසේත් නැතිනම් අපගේ හැකියාව බලපාන නිසා නොව ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ කුරුසය මත කළ දෙය නිසාය. “**ක්‍රිස්තුස් වහන්සේගේ යාගික රුධිරය කරන කොටගෙන, දෙවියන් වහන්සේගේ වරප්‍රසාදය සම්පතේ ප්‍රකාරයට අපට මිදීමත් පව් කමාවත් ලැබී ඇත**” (එපීස 1 : 7).

කෙසේ වෙතත් කෝපි කෝප්පයක් බොන්න, තේ උගුරක් තොළ ගාන්න, චිත්‍රපටියක් නරඹන්න, නටන්න, හිනාවෙන්න, සතුටුවෙන්න අපට නිදහස ඇත. නමුත් පව් කරන්න, දෙවියන් වහන්සේගෙන් ඈත්වන්න අපට නිදහස නැත. සතුටු වෙන්න, පව් නොකරන්න. ‘‘**ඔබ පාපයන්ට දාසයන්ව සිටියදී දමිටු කමේ නියමයන්ට නොබැඳී සිටියාහුය. එමඟින් කුමන ප්‍රතිඵලයක් ඇතිවීද? ඇතිවූයේ ඔබ දැන් ලැජ්ජාවට පමුණුවන මරණයෙන් කෙළවර වන ප්‍රතිඵලයකි. එහෙත් දැන් ඔබ පාපයෙන් නිදහස ලබා දෙවියන් වහන්සේගේ දාසයන්ව සිටින බැවින් සදාතන ජීවිතයෙන් කෙළවර වන විශුද්ධි මාර්ගයෙහි ඵල දරන්නාහුය**” (රෝම 6 : 20 - 22).

මේ අනුව බලන කල අපගේ නිදහස තව කෙනෙකුගේ පැකිලීමට හේතුවක් නොවිය යුතුයි. අප අපරීක්ෂාකාරී නොවිය යුතු වන්නේ අපගේ නිදහස අපහරණය නොකළ යුතු නිසාය. ජීවත්වීම සඳහා අපට නිදහස ඇතිමුත් ක්‍රිස්තුස් වහන්සේ තුළ අපගේ ගැලවීම සහතික කර දී ඇතිමුත් අපගේ හැසිරීම අප විසින් හික්මවා ගත යුතුමය. මන්ද අප අයිති වනුයේ ඓන්ද්‍රීය ක්‍රිස්තු දේහයටය. **(The Mystical Body of Christ)** (රෝම 12:5,1 කොරින්ති 12:12-27, එපීස 3:6, 4:15 - 16,5:23, කොලෝසි 1: 18,1:24). අනෙකාගේ නිදහසට අප කිසිඳු අයුරකින් පැකිලීමක් නොවිය යුත්තේ මේ නිසාමය.

“**මස් කෑමෙන්වත්, මද්‍යා පානයෙන්වත්, අන් කිසි දෙයකින්වත් ඔබේ සහෝදරයාට බාධාවක් වේ නම් එයින් වැලකී සිටීම යහපති. ඔබගේ පෞද්ගලික මත දෙවියන් වහන්සේත් ඔබත් අතර තබාගන්න. තමන් හරි යයි පිළිගන්නා දේ ගැන යමකුගේ සිත දොස් නොකියයි නම් ඒ මිනිසා වාසනාවන්තයෙකි**” (රෝම 14 : 21 - 22).



**අවසානය**

ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ සමග අප ඇණ ගැසී ඇති බව අප වටහා නොගන්නා කාරණයකි (ගලාති 2 : 20). අප අලුත් මැවිලි ලෙස නැවත ඉපදී ඇති බව ද අප නොදකිමු (2 කොරින්ති 5 : 17). කිතුනු ජීවිතය යනු මරණයෙන් ජීවිතයට ද, නැගිටීමෙන් නවමු මැවිලි ලෙස ඇවිද යාමක් ද වන්නේය (රෝම 6 : 4). අපි නවමු මැවිලි වනුයේ අප ගලවා ගත් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ආකල්පය නිසාය (පිලිප්පි 2 : 5). ක්‍රිස්තුස් වහන්සේ සමග ඇණ ගැසුණු අපගේ පරණ ස්වභාවය, අපගේ මැරුණ ශරීර ගැන සිතීමෙන් අප අල්ප මාත්‍රයක පමණකින්වත් අලුත් නොවෙමු. මරණීය ශරීර ගැන අප සිතනවා නම්, අප ගැන පමණක්ම අප සිතනවා නම් අප අපත් සමග රැගෙන යනුයේ කුණුවෙන, ඕජස් ගලන මළකඳන් පමණි. මෙම මළකඳන් සැබැවින්ම වළලා දැමිය හැක්කේ ශුද්ධාත්ම බලයෙන් පමණි. දේව වචනයේ නිරන්තර ඇසුර ද, නොකඩවා යෙදෙන යැදුම ද පරණ පාපී ජීවිතයෙන් අපව මුදවයි. එවිට ජේසුස් ක්‍රිස්තුස් වහන්සේට වහල් වීම යනු අපගේ සැබෑ විමුක්තිය වන බව අපට අවබෝධ වනු ඇත (රෝම 6 : 12 - 18).

අරමුණක් නැති, හෘද සාක්ෂියට කන් නොදෙන, වගකීමෙන් තොර නිදහස මනුෂ්‍යත්වයට එරෙහිව නිතැතින් නැගී සිටියි. එනිසාම අපි අපගේ නිදහස නොහොත් කිතුනුකමේ නිදහස පිළිබඳ යථා අවබෝධය ඇතිකර ගනිමු. අනෙකාගේ නිදහසට ගරු කරමු. මන්ද "මගේ මිනිස්කම ඔබගේ මිනිස්කම තුළ ද, ඔබගේ මිනිස්කම මාගේ මිනිස්කම තුළ ද එක්ව බැඳී ඇත්තේ අපට මිනිසුන් විය හැක්කේ එක්ව සිටීමෙන් පමණක් බැවිනි" - ඩෙස්මන්ඩ් ටුටු අගරදගුරු හිමිපාණන්.

**ගරු කෝකිල විජයවික්‍රම පෑ.තු.නි. පියතුමා**
ක්‍රිස්තුරාජ විද්‍යාලය - වැලිවේරිය

# භක්ති ප්‍රබෝධනය ඉදිරි තේමාවන්

## 2020 මාර්තු / අප්‍රියෙල් මාසය - "එතෙර වී ගැලවෙමු"

## 2020 මැයි මාසය - "වාක් ප්‍රසාද ගැබයෙනි"

හිතවත් ලේඛක / පාඨක හැම වෙත,
"භක්ති ප්‍රබෝධනය" සඟරාවේ ගුණාත්මකභාවය වැඩි කිරීමට අර්ථාන්විත, භාෂාව නිවැරදිව හසුරුවමින්, අදාළ තේමාවට ලියන ලිපි හැකි ඉක්මනින් අප වෙත එවන්න. "භක්ති ප්‍රබෝධනය" උන්නතිය සඳහා ඔබ කරන යෝජනා / විවේචන අපට අස්වැසිල්ලකි. භක්ති ප්‍රබෝධනයේ පාඨකයෝ වන්නට ඔබ දන්නා අයට ආරාධනා කිරීම ඔබද අපගේ දූත මෙහෙවරට දායක වීමකි.

**සංස්කාරක පියතුමා,**
"භක්ති ප්‍රබෝධනය" අංක 265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.
විද්‍යුත් තැපැල (ඊමේල්) : bprabodanaya@gmail.com

# නිදහස වගකීමකි

වැඩි සටනක් නොකොට ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍යයෙන් නිදහස ලද නිසා අපි නිදහසේ අගය ගණන් නොගනිමු. 1948 දී නිදහස ලැබූ පාර්ලිමේන්තුව විවෘත වීමත් සමඟ වැඩි පඩි ඉල්ලා වර්ජන රැල්ලක් ඇතිවිය. මේ වර්ජන හේතුවෙන් විප්ලවවාදී මන්ත්‍රීවරුන් දෙදෙනකුගේ මන්ත්‍රීධුරත් අහිමි විය.

කොරියානු යුද්ධය නිසා රබර් මිල ඉහළ ගොස් රටේ ආර්ථිකය සවිමත් වුවත් හර්තාල්, වර්ජන, උද්ඝෝෂණ නිසා ඩඩ්ලි සේනානායක අගමැතිතුමන්ට ඉල්ලා අස්වන්නට සිදුවිය. 1956 දී සිංහල පමණක් රාජ්‍ය භාෂාව වීමෙන් රටේ උග්‍රතම ජාතිවාදී කෝලාහලය ඇතිවිණ. වැඩ වර්ජන උත්සන්න විය. දේශපාලන කුමන්ත්‍රණයකින් බණ්ඩාරනායක අගමැතිතුමා ඝාතනය විය.

1977 දී ජේ. ආර්. ජයවර්ධන නිදහස් ලංකාවේ විශිෂ්ටතම විජයග්‍රහණය ලදත් ඉන්දියාව පෙලඹවූ සහායවූ උතුරු නැගෙනහිර ජාතිවාදී යුද්ධය රටේ ප්‍රගතිය නැවැත්විය.

සාමාන්‍ය ජනතාව දේශපාලන, ආගම්, ජාති, කුල නිසා භේද වූහ. හාල්පොත් නිසා ජනයා තවත් අලස වූහ. නිදහස් අධ්‍යාපනයෙන්වත් දරුවෝ පල නෙලා නොගත්හ. නිදහස් සෞඛ්‍යය තිබුණත් ජනයා සනීපාරක්ෂාව ගණන් නොගත් නිසා නීරෝග නොවූහ. වැල්ල, කැලය, තේ පඳුර ඔවුන්ගේ වැසිකිළි විය.

රජයේ සේවකයාත්, ගුරුවරයාත්, මන්ත්‍රීතුමාත් තමන්ගේ වගකීම ඉටු නොකළහ. දුම්රිය පමාවේ. මහජන ලිපිවලට පිළිතුරු නැත. රාජ්‍ය සේවයෙන් දුක්ගැනිවිලි වලට පිළිතුරු නැත.

හැමවිට හැමතැන විනය ගරුක නොවූ නීතිගරුක නොවූ සමාජයකි. දේශප්‍රේමයක් නැති, ආගමාලයක් (ආගම + ආලය = ආගමට ආදරය) නැති ප්‍රජාවකි. දෙව්මැදුරේ ඉඩ තිබෙද්දීත් බැතිමත්තු එළියේය. මීසමේ සමිති සමාගම්වල තනතුරු වලට පොරකන්නේ ආගමත් අමතකකරය. මගුල් ගෙයත් මළ ගෙයත් එක සමානය. වන්දනා ගමන් ජාවාරම් මෙන් විනෝද ගමන් ය.

රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම සහ මූලික යුතුකම් නැමැති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 6 වන පරිච්ඡේදයෙහි පුරවැසි යුතුකම් හා වගකීම් මැනවින් දැක්වෙන්නේය. රජය ජනයාගේ මූලික අයිතිවාසිකම් රැකීමට ඇපකැප විය යුතුය. සියලු පුරවැසියන් තමන්ටත් තම පවුල්වලටත් ප්‍රමාණවත් ආහාරපාන, ඇඳුම්පැළඳුම්, වාසස්ථාන සපයන විවේකය හා සමාජීය, සංස්කෘතිමය ඉඩප්‍රස්තා භුක්ති විඳීමට සැලසිය යුතුය. නිෂ්පාදනයේ, බෙදාහැරීමේ හා හුවමාරු කිරීමේ මාර්ග අතළොස්සක් අතර ඒකරාශී නොවිය යුතුය.



ජනතාවගේ සදාචාර හා සංස්කෘති තත්ත්වය වර්ධනය කර පෞරුෂය හැඩගස්වා ගත යුතුය. නූගත්කම තුරන්කර අධ්‍යාපනයේ හැම අවස්ථාවකදීම සර්වසාධාරණය සහතික විය යුතුය. පරිපාලනය විමධ්‍යගත කර මහජන කටයුතු වලට ජනතාව සහභාගී කරවා ගත යුතුය. කිසිම පුරවැසියකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලන මතය හා රැකියාව හේතුවෙන් කිසි අශක්නුතාවකට (නොහැකියාව / disability) පත් නොවිය යුතුය.

රජය සිය යුතුකම් පැහැර අරියි නම් ඒවා රජය ලවා ඉටුකරවා ගැනීමට ජනයා වග බලා ගත යුතුය. රජයට ඇඟිලි දිගු නොකර හැම පුද්ගලයකු හා පුද්ගලියක සිය ණය යුක්ති නොපිරිහෙළා ඉෂ්ට කළ යුතුය.

**පිලීෂන් අබයකෝන්**
හැදල

# ඇත්තෙන්ම නිදහස්ද අපි ?

දෙවියන් මිනිසාට තනා දුන් ලෝකය එකල මිනිසාට ආරක්ෂා ගෘහයක් විය. එය මවගේ ගර්භාෂය තරම් ආරක්ෂාකාරී විය. මිනිසා පරිසරය හා බද්ධ විය. එමනිසා පරිසරයේ ඔහු හා ඇය කොටස්කරුවෝ වූහ.

කාර්මික විප්ලවයෙන් පසු මිනිසා, වැඩි අස්වනු සඳහා, වැඩිපුර නිෂ්පාදනය කර, වෙළඳපොල ආර්ථිකයකට යාමට පටන් ගත්තේය. වෙළඳ ව්‍යාපාරිකයෝ ධනවත් වූහ. ධනය ලැබූ ඔවුහු බලය පසු පස හඹා ගියහ. ධනය හා බලය නිසා ඔවුන්ගේ නිෂ්පාදන පමණක්ම ගන්නැයි කියා, ඔවුහු වෙළඳ ප්‍රචාරණය පටන් ගත්හ, මානව සෞඛ්‍ය හා දර්ශක කඩා වැටීමට පටන් ගැණිනි.

ක්‍රි.ව. 1900 දී, 90% කටත් වැඩි යුරෝපීය ජාතිකයෝ ඉරුදින දිව්‍ය පූජාවට සහභාගී වුවත්, අද එය සමහර නගරවල 10% ට අඩු ප්‍රතිශතයක් ගනියි. මවගේ ගර්භාෂය තුළ කලලයේ සම්බන්ධය පෙකනි වැල වන අතර, අප සැමගේ ජීව බද්ධය දෙවියන් වහන්සේ වෙයි. පෙකනි වැල කැඩී යාමෙන් කලලය මිය යන්නා සේ, ජීව - දේව බද්ධය කැඩී යාමෙන් අප ජීවය ඉතා ඉක්මනින් අවසන් වී යා හැක.

එදා සොදොම් හා ගොමෝරා නගර විනාශයට මත්තෙන් ආබ්‍රහම් දෙවියන්ගෙන් ඉල්ලුවේ එසේ නොකරන ලෙසයි. එහෙත් දෙවියන් වහන්සේගේ බද්ධය ඇති හෙවත් සත්පුරුෂයන් එකෙකු ද නොමැති බව පසක් කළ දෙවිඳාණෝ, නගර දෙක විනාශ කළ සේක.

ඉතා ධනවත් වූ කෘෂිකර්මාන්තයක් උරුමව තිබූ අප රට වැඩි අස්වනු දෙන බව පවසා, ගෙනා කෘමිනාශක වලින්, ශ්‍රී ලංකාවේ පස මරා ජීවත් වීමට අපි උත්සහ කළෙමු. පුරාණ ගොවීහු ලියද්දට ජලය හරවා ඉන් නිකුත්වන ජලය දෝතින් රැගෙන මුවපුරා පානය කළෝය. අද එසේ කළොත් ඔවුන් මැරී වැටෙන තැනකට පත් වෙනු නොඅනුමානය. හේතුව උග්‍ර විෂ පසට හා ජලයට එක් කිරීමය.

ඉතින් අප වස කැමෙන් නිදහස් ද? මේවන විට කෘෂිකර්මය; අපට විනාශයක් වී අවසන්ය. වැටුපක් නොගෙන පස සරුකළ ගැඩවිලන් සදහටම යන්න ගොසින්ය. ආයුබෝවන් කියනා එකම ජාතිය එකිනෙකා මරා ගන්න වස කවති. විදේශ ආක්‍රමණ වලට පෙර, අප මුතුන් මිත්තන් බුලත් විටට හුණු දුම්කොල පාවිච්චි නොකළෝය. සාදික්කා, කරාබු නැටි යනාදී දේශීය ඖෂධ සාරය ඇතිව විට සැපීමට යොදා ගත්හ. පස විනාශ කිරීමට ප්‍රථමවද අප ජාතිය විට සපනවිට කියූ ඉතාමත් රසබර කථාව වනුයේ, බුලත් සත්කෝරලයේ, පුවක් සබරගමුවේ, දුම්කොල යාපනයේ හා හුණු මාතලේ බවයි.

විට සැපීම සෞඛ්‍ය සම්පන්න නූනත් අතීත ගොවීන්ගේ (නිදහසට පසු) සංහිඳියා හැඟීම් පැවේ උක්ත ලෙසිනි. අද අපි ඉන් ඔබ්බට ගොසින්ය.

ගොවිකම පසකලා වැඩි ලාභ සොයා අපට ඉතිරි වූයේ පුරන් කුඹුරු යායකි. වකුගඩු රෝග ගොන්නකි. මච්චරු මැදපෙරදිග ස්වාමිවරුන්ගෙන් ගුටිකා, ගඩොල්, බ්ලොක් ගල් ගෙවල් තනාගත්තත්, නිවස තුළ සිටින දරුවන් නිරන්තරයෙන් අපචාරයට ලක්වේ. ඔවුන්ගේ ස්වාමිපුරුෂයන් වෙල ඉස්මත්තේ කසිප්පු ජාවාරම්කරුවන්ගේ ගොදුරු වී ඇත. මත් වතුර වෙළඳාමේ යන අයවලුන් තනන රජුන්ට මනාපේ දී ඔවුන් මැතිසබේටද යවන විෂම චක්‍රයක් බවට මෙය පත්ව හමාරය. නව අධ්‍යාපනය පසුපස ගිය තරුණ පරපුර පැණිබීම බී මගදී දියවැඩියාවෙන් කෙලවර විය.

ඉතින් ඇත්තටම අපි නිදහස්ද? නැත. සරල චාම් බව වචන වලට සීමා විය. බොරුව ප්‍රචාරණය වීමෙන් සත්‍ය වසන් වී ජීවය සහජීවනය සමඟම තුරන් විය. දැන් අප සහජීවනයද අතුරුදහන් කරගනිමින් එය නොමැති රටවලින් ආනයනය කරමින් සිටියි. ගල්ෆ් කලාපයේ යුධ උණුසුමේ

9 වන පිටුවට.....

# "ඒවූ නිදහසේ ස්වර්ග රාජ්‍යයට මාගේ දේශය අවදි කරනු මැන"

## "නිදහස"..."නිදහස"... "නිදහස"

"නිදහස" ඔබ අර්ථ දක්වන්නේ කොහොමද? නිදහස අර්ථකථනය කළ හැකි ද? මම දකින්නේ එය නිශ්චිත අර්ථකථනයක් දිය නොහැකි, නමුත් විඳින්නට හැකි උත්තරීතර හැඟුමක්, අගයක්, අත්දැකීමක් ලෙස. එය සමාජයීය, දේශපාලනික, ආර්ථික, ආධ්‍යාත්මික ආදී වශයෙන් විවිධ ක්ෂේත්‍ර පුරා පැතිරුණු පුළුල් ඒ වගේම නැවුම් අත්පත් කරගැනීමක් විය යුතුයි. මේ සියල්ලටම මූලික වන ඉතා වැදගත් කාරණය චින්තනයේ නිදහස. මානව ගරුත්වය රකින්නට හැකි උතුම් මිනිසකු ගොඩනැගෙන්නට නම් නිවැරදි මඟ ගත් චින්තන නිදහස අත්‍යවශ්‍යයි.

මෙය වඩාත් පහදවන්නට සාහිත්‍ය කලා ලොවෙන් යමක් තෝරා බේරා ඔබ අබියසට ගෙනෙන්නට සිතූ මුල්ම අවස්ථාවෙම මට සිහිපත් වූ කවියක් සහ ගීතයක් තියෙනවා. මුලින්ම අපි කවිය දෙස බලමු. විශ්ව සාහිත්‍යධර රවීන්ද්‍රනාත් තාගෝරයන් ලියූ "ගීතාංජලියේ" එන ගීතමය කාව්‍යයක් මේ. මා උපුටා ගන්නේ මාධව වෛද්‍යරත්න ප්‍රකට පරිවර්තකයා විසින් සිදුකළ පරිවර්තනය.

8 වන පිටුවෙන්.....

අපේ නිදහස අවධානමක ඇත. නැවතත් අප පරිසරය හා බද්ධ වුවොතින් ගමන සරුසාරය. පාලක යෝජනාව නම් සුනිත්‍ය බලශක්ති ලංකාවේ 75% ට ඉහළ දමන ලෙසයි. මහවැලිය හරහා ඉන්දියාවට විදුලිය දීමට පම්පෝරි ගැසූ අප, අරාබිකරයට වඩා ඉන්ධන පුලුස්සා විදුලිය ජනනය කරයි. අපේ ජල විදුලිය 15% ට වටා යයි. ඉතින් අප නිදහස් ද? පසට ජීවය දෙමු, වස නොවිකුණමු, අප මෙන්ම සතා සිව්පාවුනටද කරුණා පාමු. අධ්‍යාත්මයට සවන්දී බලයට වඩා ආදරය උරුම කර ගනිමු.

**සචිත මෙන්ඩිස්**
**වෛද්‍ය නිලධාරී ප්ලාස්ටික් ශල්‍ය ඒකකය,**
**උතුරු කොළඹ රෝහල**

මගේ දේශය අවදි කරනු මැන -
(පන් තිස් වන ගීය)

කො තැනක ද තිබෙන්නේ
බිය සැකෙන් තොර වූ සිතක්
නොබා ඔසොවා තබාගෙන හිස
සිටින්නට හැකි වන තැනක්

කො තැනක ද තිබෙන්නේ
චින්තනය නිවහල් තැනක්
පටු හැඟුම් පවුරින් බෙදී ලොව
කැබැලි වී නොයනා තැනක්

සත්‍යයේ පතුළින් ම මතු වී
වදන් වැල් හැඩවෙන තැනක්
සපිරි බව වෙත නොසිඳී දිරිය ම
දෑත දිගු කරනා තැනක්



ආදි කල්පික දීන පැවතුම්
මරු කතර වැලි අතර සැඟවී
නිමල වූ දිය දහර පැණසර
අතුරුදන් නොවනා තැනක්

නිබඳව ම පැතිරී පුළුල් වන
සිතුම් පැවැතුම් හා කැරුම් වෙත
මනස මෙහෙයා ඉදිරියට ඔබ
මඟ හසර පෙන්වන තැනක්

එවන් වූ නිදහසින් පිරිපුන්
ස්වර්ග රාජ්‍යයක් ලෙසින්
පියාණෙනි මේ මගේ දේශය
අවදි කරවනු මැන ඉතින් !

"පටු අදහස් නම් පවුරින් ලෝකය" යනුවෙන් පසුකලෙක මහගමසේකරයන් ගීයකට නගා විශාරද අමරදේවයන්ගේ හඬින් ගැයෙන්නේ ද මේ පැදි පෙළයි. නිදහස අර්ථ දක්වන්නට මෙතරම් සුදුසු වෙනත් නිර්මාණයක් තවත් නැතැයි මට සිතේ. චින්තන නිදහස අහිමි වූ සමාජය ඉතා දුප්පත් සහ අඳුරු එකක් වීම වැළැක්විය නොහැකියි. එවැනි සමාජයක් ඉතා පහසුවෙන් මිථ්‍යාවට, අන්තවාදයට, නපුරට, විනාශයට ඇද දැමිය හැකියි. එවැනි ඇද වැටීම්වල බියකරු

අත්දැකීම් ලක් ඉතිහාසය පුරාම අපට අප්‍රමාණව හමුවෙනවා. නවීන තාක්ෂණයත් එක්ක ලෝකය දියුණු වෙද්දිත්, මානව අගය ගැන කතිකාවන් ලොව පුරා පැතිරෙද්දිත් ඉතාම ලෙහෙසියෙන් අපේ සමාජය මිථ්‍යාවට, අන්තවාදයට ඇද දැමිය හැකි පසුබිමක් පවතින්නේ ඇයි? අප තවමත් චින්තන නිදහස අත්පත් කරගත් දියුණු ආධ්‍යාත්මිකත්වයක් සහිත මිනිසුන් නොවන නිසයි.

ඉහත පද්‍යය තුළ තාගෝරයන් අපට ඇරයුම් කරන්නේ පටු ආකල්පවලින් මිදී චින්තනමය නිදහස අත්පත් කරගන්නා ලෙසයි. නොබියව හිස කෙළින් තබාගෙන අදීන මිනිසුන් ලෙස දිවි ගෙවන්නට නම් අප මහ පොළවට මුල් ඇදගත් මහා වෘක්ෂයන් මෙන් ශක්තිමත් විය යුතුයි. ඒ ශක්තිය අප වෙත ලැබෙන්නට නම් දැනුමින්, අත්දැකීමෙන්, ආකල්පවලින් පොහොසත් මිනිසුන් ලෙස ගොඩනැගීම අත්‍යවශ්‍යයි. ඒ සඳහා අපගේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශාල වෙනසක් සිදුවිය යුතු බව ඉතාම පැහැදිලියි. ඒ වගේම අපගේ සාහිත්‍ය කලා ඇසුර, සමාජ දේශපාලන ක්‍රියාකාරිත්වයන්, ආගමික අන්තවාදයන්ගෙන් මිදුණු සැබෑ ධාර්මික පැවැත්ම අප කෙබඳු පෞරුෂයක් සහිත මිනිසුන්ද යන වග තීරණය කරාවි.

''නිදහස'' යන වදන සමග ම මට සිහිපත් වන ගීතයක් පිළිබඳව මා මුලින් සඳහන් කළා. ඒ ජෝන් ලෙනන්ගේ "Imagine". මානව ගරුත්වය සහ මිනිස් නිදහස වෙනුවෙන් හඬ අවදි කළ මානවවාදී කලාකරුවකු ලෙස අදත් ලොව පුරා ලෙනන් ගෞරවාදරයට පාත්‍රවෙනවා. ලෙනන් "Imagine" ගීතයෙන් මතු කරන අදහස පිළිබඳව සමහරවිට



ඔබ එකඟ නොවන්නට ද පුළුවන්. ස්වර්ගයක් නැති, අපායක් නැති, ආගමක් නැති, රටක් කියා දෙයක් නැති ලෝකයක් ගැන අදහස සාම්ප්‍රදායික ජාතික, ආගමික ළැදියාවෙන් පිරුණු හදවතකට දරන්නට අසීරු වේවි. නමුත් මා කැමතියි ඔබගෙන් ඉල්ලන්න, වඩා ගැඹුරින් මේ ගීතය දකින්න කියලා. රට, ජාතිය, ආගම වෙනුවෙන් අනෙකාගේ විනාශය පතන ලෝකය ඉක්මවා ගිහින් මනුෂ්‍යත්වය ගැන අලුතින් සිතන්නයි මේ ගීතය අපට ඇරයුම් කරනුයේ.

**සිතන්න**
**නොමැතියැයි දෙව් ලොවක් කියා යමක්**
**හිසට ඉහලින් ඇත්තේ නිල් අහස පමණක් ම යැයි**
**නැති වග අපායක් සැඟව මහපොළොව පතුලත**
**අපහසු නොවේ එය උත්සහ කළොත් නුඹ**

**සිතන්න**
**ලොවක් වේ යැයි**
**දිවිගෙවන සියල්ලෝ**
**අද ගැන පමණක් ම සිතන**

**සිතන්න**
**ලොවක් වේ යැයි**
**රටක් කියා දෙයක් නොමැති**
**නොමැත කිසි හේතුවක් මරන්නට මියෙන්නට**
**සිතනු මැන ලොවක් ගැන නැති එකදු ආගමක්**
**ලෝකයේ සියලු දෙන සාමයෙන් දිවි ගෙවන**

**කියනු ඇත නුඹ**
**සිහින දකින්නෙකැයි මම**
**නොවෙමි මම එකම මිනිසා**
**දකින ඒ සිහිනය**
**පතමි යම් දිනෙක පැමිණතැයි ඔබ**
**දකිනට ඒ සිහිනය එක්ව අප සමග**
**ලොව සැමට සමවනා තැනක් වනු ඇත එදින...**

මෙම පරිවර්තනය කවියකු, ගත්කතුවරයකු වන වෛද්‍ය නුවන් තොටවත්ත සහෝදරයාගේ. මෙම කවි පෙළත්, ගීතයත් ''නිදහස'' පිළිබඳ අලුත් සිතීමකට ඔබට මග පෙන්වනු ඇත යන්න මාගේ විශ්වාසයයි.

**තරංගනී රෙසිකා කුමාරි ප්‍රනාන්දු**

# "බැලන්ස් කර ගැනීම" (සමබර කිරීම)

**නිදහස යනු**
සිතූ සිතූ දේ කිරීම ද ? මුකුත්ම නොකර සිටීමද ?

**බලන් කඩතුරා සිඳ...**
''නිදහස'' පුළුං රොදක් සේ සැහැල්ලුයි. ''නිදහස'' ඊයම් බරුවක් සේ බරයි.

**මෙහෙම කිව්වොත්...**
නිදහස කියන්නේ නිහඬව නොසිට ප්‍රශ්න කිරීමයි.... ප්‍රශ්න නොකර නිහඬ වීමත් නිදහසය !

**හිතලා බලන්න...**
සම්මතය කඩා ගෙන ගොස් අසම්මත වීම නිදහසයි.
හීලෑ කරගෙන අසම්මතය නැවත සම්මතය කරා රැගෙන ඒමත් නිදහසයි.

**තව පැත්තකින්...**
ශරීරය ඉල්ලන නෙක ආශාවන් ඉෂ්ට කර ගැනීම නිදහසයි.
නිදහස කියන්නේ ශරීරය ඉල්ලන හැම ආශාවම ඉෂ්ට කර ගැනීමම ද ?

**මෙහෙමත් අහන්න...**
සිතට දැනෙන දේ එලෙසම නිදහසේ ප්‍රකාශ කිරීම ද කලාව ?
සීමා මායිම් එක්ක සිතට දැනෙන දේ ප්‍රකාශ කිරීම කලාවක් නොවෙයිද ?

**නිදහසද...**
අලුත් අලුත් දෑ තනන්නටම රුචි වීම ? එතකොට පරණ දෑ
සහමුලින්ම විසි නොකර ඒවා සුරකින එක ?

**තවදුරටත්...**
ලැබෙන කාලයට තහංචි නොදමා පාවිච්චි කරන්නට ලැබීම නිදහසයි.
ලැබෙන කාලයට තහංචි දමා කළමණාකරණය කර ගන්න එක නිදහසයි.

**තව ගැඹුරට...**
පය ගහලා ඉන්න සමාජය ඔය විදහටම තිබුණාවේ කියන හිත හදා ගන්න තැන නිදහස ද ?
මං වෙනස්වෙන තැන පය ගහලා ඉන්න සමාජයත් වෙනස් වේය යන්නට හිත හදාගන්න තැන නිදහස ද ?

**ඉතිං දයාබර කොල්ලනේ කෙල්ලනේ.......**
බැලන්ස් කරන්න (සමබර කරන්න) ඉගෙන ගමු. තරුණ කාලේ අපි හොයන්නෙම ඔය කියන **"නිදහසයි"**. නමුත් නිදහස යට තියෙන **"වගකීම"** (Responsibility) අපි අඳුන නොගත්තොත් ඔක්කොම හබක් ! ඒ නිසා වගකීම තුළින් නිදහස බැලන්ස් කර ගත්තොත් ඔයා දිනුම් !

2020 වර්ෂයේ ඔබේ ජීවිතේ නිදහස හරියට බැලන්ස් කර ගන්නට
ශුද්ධාත්මයාණෝ ඔබ සැමට බලය දෙත්වා !

**ගරු දිනේෂ් කිර්තිසිංහ පියතුමා**
**මීසම් සේවක, සාන්ත මරියා දෙව්මැදුර - හපුගොඩ**

# නිදහසට වහල් වී



එදා .....
අනේක විධ කැපවීම් කර
ජීවිත පූජා කොට .... දිනූ
අද .....
වසරක් පාසා අභිමානයෙන් සමරන නිදහස,
දිනයක් නුඹ නමින් වෙන් කළද
හැම තැනම නුඹේ නම කියවුණද
නුඹව හරි හැටි තේරුම් ගත් කෙනකු
මුණ නොගැසුණෙමි .......

පිට රටින් බඩු පුරවාගත් නැව් එනතුරු
මාධ්‍ය හරහා දොස් පවරන
ජාතියක් වුණෝ අප ඔබ නිසාද ?
උගත්, බුද්ධිමත් මහ පිරිස
සයිටම් වසා දැමීමට ....
පෙළ ගැසුනේ නුඹ නිසාද ?

සැපතට, ආශාවට වහල් වී
භුක්ති විඳිති අයෙක් නිදහස
දිළිඳුකමින්, අධ්‍යාපනයෙන් එතෙර වන්නට
නිදහසට වැට බැඳි තවත් අයෙකි

අභිමානයෙන් සමරන්නට නම්
නිදහස අත්පත් කරගත යුතු නොවේද ?

**කුමාරි පෙරේරා** - උතුරු කළුතර

# නිදහසක් නැති නිදහසක්

නිදහසක් නැති නිදහසක්.....
සමරමු අපි මහ ඉහලින්.....
බියෙන් තොරව දිවි ගෙවුමට.....
නිදහස් සිතුවිලි ජීවත් කරනට.....
ඉඩක් නොමැති දේශයක.....
දිළින්දා, දරිද්‍රයා, පාගා දමා.....
පීඩකයන්, ධනවතුන්,
රජ කරන සමාජයක.....
නිදහසක් කොහෙද ? තවත්.....
දිළිඳුන්ට, පීඩිතයන්ට සැබෑ නිදහස.....
උදාවන සුබාරංචිය දේව රාජ්‍යයයි.....
දෙව් රජය ඔබ තුළයි..... මා තුළයි.....
අවදි වෙමු දැන්වත්
ජේසුගේ නාමයෙන්......

**ලුෂන් එඩ්වඩ් පෙරේරා**
- ගෝනවල



# නිදහස නව මානයකින් !!!

පෙබරවාරි මාසය අප ලක් වැසියන් ට විශේෂ මාසයකි. මන්ද, ඒ ලක් මවට නිදහස ලැබූ මාසයයි. ඒ උතුම් දිනය වර්ෂ 1948 පෙබරවාරි මාසයේ 04 වනදා ය. මේ දිනය ඉතා උත්කර්ෂවත් ලෙස සැමරීම රාජ්‍ය තන්ත්‍රයේ අනුග්‍රහයෙන් සිදුවන්නකි.

විදේශීය පාලනයෙන් මිදීම, මේ නිදහස ලෙස අපි හඳුන්වමු. පෘතුගීසීන් ලන්දේසීන් හා ඉංග්‍රීසින් යන විදේශීයයන්ගේ පාලනයට නතු වී තිබූ ලංකාව, දේශීය පාලනයට අවසර ලැබීම මෙම නිදහස යන්නෙන් අර්ථ දැක්වේ. නමුත්, අප අද ඇත්තෙන්ම නිදහස් මිනිස්සු ද ? අප රටක් ලෙස නිදහස ලැබුව ද, පුද්ගලයින් ලෙස තවමත් වහල් තත්ත්වයේ පසුවන බව අපට අමතක වී ඇත. වැරදි පුරුදුවලට නොහික්මුණු ආශාවන්ට, ධනයට, බලයට, නිලයට අප කොතෙක් නම් වහල් වී ඇති ද? මිනිසත් බව ලැබීමේ උතුම් බව සාක්ෂාත් වනුයේ මේ වහල් භාවයෙන් නිදහස ලැබූ දිනට ය.

දෙවිඳුන් අදහන ජනතාවක් ලෙස, මේ විශ්වයේ මැවුම්කරු, මහෝත්තම වූ දෙවි පියාණන් වහන්සේ බව අපි අදහමු. උන්වහන්සේ මිනිසා මැව්වේ, නිදහස් කැමැත්ත නැමැති උතුම් දායාදය සමඟය. ඒ නිසා මිනිසා උඩඟු වී තම නිදහස නැති කර ගත්තේ ය. අප ආදි මව්පියන්ට පමණක් නොව, මුළු සංහතියට ම නිදහස නැති විය. එසේ වුව ද, අප දෙවිපියාණන් වහන්සේ ගේ අති මහත් වූ කරුණාව හා ආදරය නිසාම උන්වහන්සේ මේ පාපී මිනිසා අත් හැර දැමුවේ නැත. තමාගේම පුතණුවන්, තම මැවිල්ල තුළින් ම මෙලොවට පමුණුවා මිනිසා පව්කාරයකුව සිටියදී ම, ඒ වෙනුවෙන් වන්දියක් ලෙසින් පූජා වීමට සැලැස්ම වූ සේක. ක්‍රිස්තුස් වහන්සේ ගේ අමිල වූ යාගය තුළින් අප නැවතත් නිදහස ලබා ගනිමු. ඒ දේව කරුණාවේ අනුහසිනි.

මේ ලබාගත් නිදහස අයාලේ භුක්ති විඳින්නක් නොවිය යුතුය. අපේ නිදහස තවත් පුද්ගලයෙකුගේ ජීවිතයට බාධා නොවිය යුතුය. ඔබගේ නිදහස අනිකා ගේ නාසයේ කෙළවරින් අවසන් විය යුතු ය. නිදහස යනු මට අවශ්‍ය දේ කෙසේ හෝ ලබා ගැනීමේ හෝ ක්‍රියාවට නැංවීමේ අයිතියක් නොව දේව සැලැස්ම තුළ ක්‍රියාත්මක කිරීමට ඇති වගකීමයි.

කරුණු එසේ නම් අප කතා කළ යුත්තේ ද, ක්‍රියා කළ යුත්තේ ද දෙවිපියාණන් වහන්සේගේ අභිමතය අනුව ය. එනම් යහපත සඳහා ය. මේ නිවැරදි අවබෝධය නොලැබීමේ හේතුවෙන් විදේශීයයන් ගෙන් අප රටවැසියන් ලද නිදහස නිසි අයුරින් භුක්ති විඳීමට නොලැබී ඇත. අප විදේශීය පාලනය වෙතින් පමණක් නොව පාපයේ ග්‍රහණයෙන් නිදහස ලැබිය යුතුය. ඒ සඳහා ප්‍රඥාවන්ත විය යුතු ය. ගැඹුරින් අවබෝධ කර ගත යුතු ය.

එපමණක් ද නොව නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍යය ආදිය අප රට තුළ හුදු වචන මාත්‍ර පමණක් වී ඇත. නිදහසේ සිතන්නට, නිදහසේ නිර්මාණය කරන්නට, නිදහසේ අදහස් එළි දක්වන්නට දරුවන්ට ඇති අයිතිය නොයෙකුත් මාදිලියේ අධ්‍යාපනික පත්තරවලින් මුළුමනින් ම ලොප් කර දමා ඇත. ළමා ලෝකයේ යහළුයෙහෙළියන් සමඟ සෙල්ලම් කිරීම, පරිසරය රස විඳීම ආදිය, අධ්‍යාපනික තරඟයෙන් හා විභාග කේන්ද්‍රීය අධ්‍යාපනයෙන් මුළුමනින් ම දරුවන්ට අහිමි කර ඇත. ඉතින්, අප ලක් දරුවන්ට කිනම් නිදහසක් ද ? ඉමහත් වටිනාකමක් දී ඇති මාධ්‍ය නිදහස නිසා අපේ ආලින්දයේ විශේෂ තැනක් ගන්නා රූපවාහිනිය ද අපේ නිදහස අපට අහිමි කර ඇත. එදිනෙදා අපේ ආහාර වේල ද, අඳින පලඳින ඇඳුම් - ආයිත්තම් ද, භාවිත කරන බේත් හේත් ද ඇතුළුව ජීවිතයට අදාළ සියල්ල පාහේ තෝරා ගැනීමට අප මෙහෙයවන්නා ද බොහෝ විට මෙම රූපවාහිනී පෙට්ටියයි.

මේ නයින් බලන කල සැබෑ නිදහස සැමරීමට නම්, අප ලෞකික වශයෙන් මෙන්ම ලෝකෝත්තර වශයෙන් ද නිදහස් මිනිසුන් වීමට වෙර දැරිය යුතුය. එවන් සැබෑ නිදහසක් අප ලක් දරුවන්ට ලැබේවා යන්න මාගේ ප්‍රාර්ථනාවයි.

**ජේ.ඒ.ඩී. රෝහිණී ජයසිංහ,** හාල්දඬුවන, දංකොටුව

# නිදහස සහ වගකීම



සියපත් විකසිතව ගවසන සිත් සුවය
සිත් ගත් සහස්පත් රූ දෙනයන සිඹින
දෙව් පෙම් අම නදිය ඉතිරෙන විසල් වන
නොපෙනෙන තරම් අඳ වී සිත් තැවුල් වන

අඩවත් අරුංගල් ලා සැරසී ලලනා
සිතුසේ සරන නිදහස පිළිකුල් සිතෙනා
සිතුමිණ සොයා රන් ජීවිත බිලි තියනා
කිම මේ මනු සතුන් සිත් ගුණ මිලින වෙලා

පංකජ වුවත් නෙළුමක් විය හැකි සිතට
දොරගලු දමා වළලා නිහඬව නිදන
හදවත මරා සිතුසේ නිදහස සොයන
නිවනට දුරයි මිනිසුනි කුමටද දිවිය

තණ අග සිහිල් බිඳු දොවා සුව විඳින
අන් සත සුවය පතනා සිත් රන් වටින
ප්‍රේමය ලබන දෙන තැන සිත් සුව අමර
මිහිපිට නිවන එතැනයි නිදහස දිලෙන

මිහිපිට ජනිත වූ දින නිදහස ලබනා
ඒ නිදහසට වගකිව යුතු බව දැනෙනා
බෝසත් ගුණෙන් පිරිපුන් මිනිසුන් අගනා
නිදහස් දනව්වක සිතුසේ කල් හරිනා

**අචල රූපසිංහ**
නිරිපොල, හංවැල්ල

# අම්මා



අම්මේ ....... ////
ලේ කිරි කර මට පෙවූ නිසා
අම්මා මාගේ පණ තමා .... //
අම්මේ ......... ////

ලොකු දුකක් ඉවසලා එදා
මෙලොව දැක්කා ඔබ නිසා
කවුරුවත් නෑ මව වගේ
ආදරේ මට පුද කළේ

අම්මේ ........ ////

හඬපු කඳුළුත් සතුටු කඳුළු වෙලා
යන්නේ මා නිසා
ආදරෙයි මා ආදරෙයි
අම්මේ නුඹට සැමදා

අම්මේ ........ ////

මහ මෙරක් සේ ආදරේ නුඹ
කළා මට මගෙ දිවි තුරා
හැමදා මා හා සිටියොතින් ළඟ
ශක්තියක් වෙයි දිවි පුරා
අම්මේ ........ ////

මෙම ගීතය රචනා කරන ලද්දේ මවකගේ සෙනෙහස මතු කරන්නටය. හඬපු කඳුලුත් සතුටු කඳුළු වෙලා යන්නේ මා නිසයි. මවුවරුන් දරුවන් සමඟ සිටියොත් ශක්තියක් වෙන බව මෙම ගීතයෙන් මම ඉදිරිපත් කරමි.

**ගී රචනය සහ තනුව : රුචිර අශාන් පෙරේරා**
**(අ.පො.ස. සා/පෙළ - 2019)**
සිංහල විදුහල, කණිජ වැලි කර්මාන්ත ශාලාව,
පුල්මුඩේ

# උදුරාගත නොහැකි නිදහස.....!

## තෝරාගැනීමේ නිදහස

පටු මාවතකි, රෝස පඳුරකි. පටු මාවතේ ඇවිද යන තරුණයෙකි. රෝස පඳුර අසල නතර වූ තරුණයා, රෝස පඳුරෙන් විකසිත වු රතු රෝස මල දෙස බලා ආදරයෙන් සිපගෙන

"මල දකින සිත

සතුටු වෙයි සිත

සුවඳ විඳ විඳ

ලබමි මිහිරක්" කවි පදය මුමුණමින් යන්නට විය. එම පටුමගේ ගමන් කරන තවත් තරුණයෙකි. රතු රෝස මල දෙස බලා සිට එකවරම රෝස මල නටුවෙන් කඩා, අතින් පොඩි කර පයින් පාගා දමා යන්නට ගියේ කුමක්දෝ මැසිවිල්ලක් කොඳුරමින්ය. රතු රෝස මල උත්තේජක යයි. තරුණයන් දෙදෙනාට මේ එකම උත්තේජකයට, එකිනෙකට ප්‍රතිවිරුද්ධ ප්‍රතිචාර දැක්වීමක් ඇති වන්නේ කෙසේ ද? මෙම චර්යාවල වෙනස පැහැදිලි කිරීම අපට උදව් වන්නේ මනෝචිකිත්සක, වික්ටර් ෆ්‍රැන්කල් විද්වතාය. විෂ වායු කුටිවල මිනිසුන් මරා දමන හිට්ලර්ගේ නාසි සිර කඳවුරේදී ජීවිතය අත්විඳිය හැකි කෲරතම අත්විඳීම් වලට ගොදුරු වු ෆ්‍රැන්කල්ට ආත්ම අවබෝධයෙන් යුත් අයකු ලෙස තමන්ට සිදුවන සිදුවීම් දෙස නිරීක්ෂකයකු ලෙස දකින්නට හැකිවිය. මෙලෙස මේ සියල්ල ඔහුට බලපාන්නේ කෙසේ දැයි යන්න තීරණය කරන්නට හැකිවිය. ඉතාම දුෂ්කර අවස්ථාවක වුවද, තමන් කළ යුත්තේ කුමක්දැයි තීරණය කිරීමේ නිදහස ඔහු අත්වින්දේය. මෙන්න මේ නිදහසයි, කිසිවකුට අපෙන් උදුරා ගත නොහැකි නිදහස. මෙමගින් වික්ටර් ෆ්‍රැන්කල් මිනිස් ස්වභාවය පිළිබඳ මූල සිද්ධාන්තයක් වන, "උත්තේජය සහ ප්‍රතිචාරය අතර මිනිසාට තෝරා ගැනීමේ නිදහස ඇත ." යන මිනිසකු ලෙස තමන්ට ලැබී ඇති ආත්ම අවබෝධ දීමනාව යොදාගෙන සොයා ගත්තේය.

## අද්විතීය මිනිසා

සකල මැවිල්ලේම ප්‍රාණීන්ගෙන් මිනිසාට දෙවිදාණන් විසින් දානය කරන ලද සුවිශේෂ දීමනා නිසාය මිනිසා අද්විතීය වන්නේ. ආත්ම අවබෝධයට අමතරව අපව පොහොසත් කරන දීමනාවකි, පවතින යථාර්ථයෙන් ඔබ්බට සිත යොමුවෙමින් අලුත් යමක් සිතේ නිර්මාණය කර ගත හැකි පරිකල්පනය. එමෙන්ම හරිදේ කුමක්ද, වැරදි දේ කුමක්ද, අපේ චර්යා කෙරෙහි බලපාන මූලධර්ම මොනවාද සහ ඒවා අපේ සිතිවිලි වලට බලපාන්නේ කෙසේද යන්න පිළිබඳ ගැඹුරු අවබෝධය ලබාදෙන **හෘදය සාක්ෂිය,** අපට ලැබී ඇති උතුම්ම දීමනාවකි. එමෙන්ම කිසිදු බල පැවැත්මකින් තොරව අපේ ආත්ම අවබෝධය මත ක්‍රියා කිරීමට ඇති හැකියාව වන **නිදහස් කැමැත්ත,** අපට ලැබී ඇති අනික් දීමනාවය.

## නිදහසෙන් පැවරෙන වගකීම

"තෝරා ගැනීමේ නිදහස" තහවුරු කරන අද්විතීය දීමනාවලින් වරම්ලත් අපට එම දීමනාවන් ප්‍රශස්ත ලෙස යොදා ගැනීමේ වගකීම පැවරී ඇත. ඒ වගකීම ඉටු කිරීමෙන් මිනිසුන් ලෙස අපි අපේ ජීවිතවල වගකීම බාරගන්නෙමු. එසේ බාර ගන්නා විට අපේ ජීවිත පමණක් නොව සමස්ත මානව සමාජයේ සහ සොබාදහමේ පැවැත්මේ වගකීමද අපි බාර ගන්නෙමු. අද සමාජයේ පවතින අසාධාරණකම්, වංචා දූෂණ, ප්‍රචණ්ඩත්වයන්, දුක්විඳීම්, පීඩාවන් ඇතිකරන්නේත් මේ **"තෝරාගැනීමේ නිදහස"** ලබා ඇති මිනිසුන්ය. එමෙන්ම මේ සියලු අපචාර සිදුවන විටත් **කිසිවක් නොකර බලා සිටින්නේත් මේ උතුම් නිදහස ලැබූ මිනිසුන්මය.**

ධනයට, බලයට, කීර්තියට තම හෘදය සාක්ෂිය උකසට තබන සමාජයක **"නිදහස"** පැළ දොරින් පිටවීම වැළැක්විය නොහැකිය. අපේ සාමයික සහ සමාජීය ව්‍යායාමයන්ගෙන්, හෘද සාක්ෂිගත අවබෝධය ලබාදීමේ යොමුවකට අපප

එළඹිය යුතුය. එවැනි අවබෝධයකින් සමාජ, දේශපාලන, ආර්ථික, සංස්කෘතික උත්තේජ ඉදිරියේ "තෝරා ගැනීමේ නිදහස" ප්‍රශස්ත ලෙස අභ්‍යාස කිරීමට හැකිවනු ඇත.

**"ජීවිත දර්ශනයක් නැති තැන විනයක් නැත. විනය රක්නා අය වාසනාවන්තය"**

**(හිතෝපදේශ 29:18).**

පෞද්ගලිකවත්, පවුලක් ලෙසත්, සමාජයක් ලෙසත්, දේශයක් ලෙස ජීවිත දැක්මක් නැතිනම් විනය නැති වී ජීවිතය අතරමංකර ගනියි. තමන් සතු විභවයන් එළිදක්වන්නට ගාමක බලය (අරමුණක් කරා යාමට අවශ්‍ය තල්ලුකිරීමක් - Motivation Force) උත්පාදනය වන්නේ තමන්ගේ ජීවිත දැක්මෙන්ය. දැක්ම නිර්මාණය කර ගැනීමේදී අපට ඉවහල් වන්නේ දෙවිඳාණන් විසින් අපට දානය කර ඇති පරිකල්පනයයි. උදාකර ගන්නා අනාගත තත්ත්වය සිතෙහි නිර්මාණය කරගන්නේ මෙම පරිකල්පනයෙන්ය. **හැම සත්‍යයකටම සඵල සහ ප්‍රතික්ෂේප කළ නොහැකි පැවැත්මක් පවතින්නේ මිනිසුන්ගේ පරිකල්පනය තුළ පමණයි. තම නිමැවුම් නොව පරිකල්පනයයි. ජීවිතයේ මෙන්ම කලාවේ පරම ස්වාමියා (ජෝසප් කොන්රඩ්) විනයානුකුල යහපත් සමාජයක් ගොඩ නඟන්නට නම් අප හැම අපේ ජීවිත මෙන්ම සමාජයේ ජීවිතයද, ජීවිත දැක්මකින් මෙහෙය විය යුතුය.**

බාහිර බලපෑම් මත තීරණ ගන්නා සිදුකරන්නේ තමන්ට ලැබී ඇති උතුම් දීමනාවක් වන, **"නිදහස් කැමැත්ත"** පාවාදීමකි. මෙවැන්නක් කරනුයේ තමන්ට සිදුවන ආපදා සියල්ල අන් අය මත පටවා අසුබවාදීව ජීවත් වීමය. ඔවුහු හැමවිටම අනුන්ගේ උත්සාහයට බාධා කරති. මෙවැන්නන් සැබැවින්ම කරුමක්කාරයන්ය. එලෙස පවතින පවුලක් කරුමක්කාර පවුලකි. එමෙන්ම මෙවැනි දේශයක් කරුමක්කාර දේශයකි. නිදහස් කැමැත්ත මත තීරණ ගෙන ක්‍රියා කරන විට ආත්ම විශ්වාසය ගොඩනගා ගනිමින් ස්වයං විනයකින් ප්‍රගමනය වේ.

**"ඔබේ ඉරණම හැඩගැහෙන්නේ, ඔබ තීරණය ගන්නා මොහොතේදීය." (ඇන්තනි රොඩ්කිස්)**

## කිතුනු අපේ නිදහසේ වගකීම

"තෝරා ගැනීමේ නිදහස" තම ජීවිතයෙන් විශිෂ්ට ලෙස ප්‍රකාශ කළ ජේසුස් වහන්සේ සමස්ත මානව වර්ගයාටම පරමාදර්ශයක් වූහ. කිතුනුවන් වන අපේ මාර්ගයද, සත්‍යයද, ජීවනයද වන ජේසු සමිඳුන් මෙන් තෝරා ගැනීමේ නිදහසෙන් කැමැත්තෙන් පැවරෙන වගකීම් ඉටුකිරීමට ඇප කැප විය යුතුය. ජේසුස් වහන්සේ කවුරුන්ද, තමන්ගේ ජීවිත මෙහෙවර කුමක්ද යන්න පිළිබඳ ආත්ම අවබෝධයෙන් පහදාගත් සේ අපද අප කවුද, අපේ මෙහෙවර කුමක්ද යන්න මැනවින් අවබෝධ කරගත යුතුය. උන්වහන්සේගේ ජීවිතය මෙහෙය වුණේ, **"දේව රාජ්‍යයේ" දැක්මෙන්ය. දේව රාජ්‍ය යනු ජනතාව අතර ගැලවීමේ ක්‍රියාවක් ලෙස දෙවියන් වහන්සේ විසින් සලසනු ලබන ප්‍රේමය, සාධාරණත්වය, හා සාමය විදහාපාන ඉලක්ක සමාජය තුළින් මතුකර ගැනීමයි.**

ශ්‍රී ලාංකීක පුරවැසියන් ලෙස ශ්‍රී ලංකාව, ප්‍රේමය, සාධාරණත්වය හා සාමය විදහාපාන දේශයක් බවට පත්කිරීමට අප ඇප කැප විය යුතුය. මේ අනුව ජේසුස් වහන්සේ එදා ඊශ්‍රායලයේදී තම දිවැසිවරය ප්‍රකාශ කළාක් මෙන් අපිද යහපත සහ සත්‍ය ප්‍රකාශ කරමින් දිළිඳුනට, පීඩිතයනට ගැලවීමේ සුපුවත ප්‍රකාශ කිරීම අපගේ දිවැසි කැඳවීමයි. මේ සඳහා අපේ දේශය තුළ දේව රාජ්‍යයට අනුරූප දැක්මක් නිර්මාණය කර ගැනීමේ මෙහෙවරේ යෙදිය යුතුය. කිතුනු වටිනාකම් මත අපේ හෘදය සාක්ෂිගත අවබෝධය නංවා ගනිමු. ධනයට, බලයට, කීර්තියට යට නොවී නිදහස් කැමැත්ත මත තීරණ ගැනීමට කැපවෙමු. මේ උතුම් නිදහස පාවා නොදී අපට පැවරී ඇති පෞද්ගලික සහ සමාජ වගකීම් ඉටු කිරීමෙන් අපේ දේශය, නිදහසේ ස්වර්ග රාජ්‍යයක් කරමු.

**වි. ලෙ. පීරිස්**

# ළමා ප්‍රබෝධනය



## රටත් නිදහස්, ගමත් නිදහස් ඒත්...... ඔබ, මම නිදහස් ද ?

ඉන්දියන් සාගරයේ මුතු ඇටය වන මේ ලංකාද්වීපය 1948 වසරේ පෙබරවාරි 04 දින, ලංකාවේ වීරයෝ, ආක්‍රමණ පරදා සදා නිවහල් රටක් බවට පත් කළහ. එනිසා ඔබත්, මමත් අපගේ සහෝදර සහෝදරියන් සමඟ සතුටින් කල් ගෙවමු. මේ අයුරින් රටත් ගමත් නිදහස් නමුත් ඔබේ, මගේ අධ්‍යාත්මය නිදහස් ද? අපි අද නවීන තාක්ෂණික ලොවත් සමග උරෙන් උර ගැටෙමින් ඔබේ, මගේ නිදහස සොයමු. දෙමාපියන් ලෙස දරුවන් සමඟ නිවසේ බිත්ති හතරට කොටු වී කල් ගෙවති. ගුරුවරු දරුවන් සිය ගණනක් සමඟ පැය හයක් මුළුල්ලේ, විදුහල්පතිවරයෙකුට යටත්ව කල් ගෙවති. ඔබත්, මමත් ලෞකික නිදහස කෙසේ හෝ සොයා ගනිමු. එහෙත් ආධ්‍යාත්මික දිවියේ නිදහස සෙවීමට වෙහෙස නොවෙමු. අප වෙහෙස විය යුත්තේ ආධ්‍යාත්මික නිදහස සෙවීමටය. මක්නිසාද, මෙලොව තුළ ඔබ ලබන, ඔබ සොයන නිදහස, අප මරණින් පසු යන තැනට නුසුදුසු වන බැවිණි. එදා නික්මයාම කථාව තුළ පාරාවෝ රජතුමන්ට, ජුදෙව්වෝ බැල මෙහෙවර කරමින් වහලුන් වී සිටියහ. එයින් ගලවා ගැනීමට මෝසෙස් යැවිණ. මේ ගැලවීම තුළ ඔවුහු ආධ්‍යාත්මික හා ලෞකිකව නිදහස අත් කර ගත්හ. අපත් පාපයට වහලුන් නොවී, සැබෑ ආධ්‍යාත්මික නිදහස ලබා ගැනීමට දෙව් වරම් පතමු.

අද සමාජය, එදා මෙන් නොව, අයුක්තිය, අසාධාරණය, අනීතිය රජයන සමාජයකි. නීතිය රැකීමට පොරොන්දු දී ඇති විවිධ ආයතන පවා ඔවුන්ට වාසි සහගත ලෙස නීතිය හැඩගස්වා ගෙන ඇත. අද පුංචි දරුවා තුළ පවා නිදහසක් නැත. මක්නිසාද, පාසලෙන් පසු ටියුෂන් පන්ති යන බැවිණි. ඔහුගේ ළමා කල පටන් ටියුෂනයට යොමු වීමෙන්, එම දරුවා ආධ්‍යාත්මිකව පිරිහේ. ඒ නිසා මල් වැනි පුංචි දරුවන්ගේ අධ්‍යාත්මය විනාශ නොකර තව තවත් දෙව්පුතු වෙත ළං කර ඔහුගේ අධ්‍යාත්මයට නව ඉණිමගක් එක් කරමු. අද සමාජයේ බොහෝ දෙනා, අනිකාව පරයා ඉදිරියට යාමට වෙර දරති. මෙම වෙර දැරීම පාසල් දරුවකු තුළ නම් ඒ ඔහුගේ උත්සාහයක් නොව, තම දෙමාපියන්ගේ වෙර දැරීමකි. "පුතේ උඹ මේ පාර ලකුණු ගත්තේ නැත්නම් ගෙදර එන්ට එපා" යනුවෙන් දෙමාපියෝ පවසති. මෙසේ කිරීමෙන් ඔහුගේ නිදහස බිඳ වැටී, මානසිකවද අඩපණ වේ. අපි දරුවන්ට තර්ජනය නොකර, ඔවුන්ගේ තරමට කටයුතු කරන්නට ඉඩ හරිමු. දරුවා යනු මලක් ය. මලක් ගසකින් කැඩුවොත් මලට කෙතරම් වේදනා ද? දරුවන්ට ද ඒ හා සමාන වේදනා දැනේ. පුංචි මලක් විකසිත නොකර පිපී ලොව සුවඳ කරවන්නට දෙමාපියන් ලෙස දෙව් වරම් පතමු.

අප කතෝලිකයන් ලෙස, නිදහස සෙවීමට වෙහෙසන අයුරු අපිම අසා බලමු. රටත්, ගමත්, නිදහස් නමුත් ඔබත්, මමත් නිදහස් ද? ක්‍රිස්තුන් වහන්සේ අනුගාමී වන අපට ලෞකීක සතුට එලක් නැත. අප සෙවිය යුත්තේ ආධ්‍යාත්මික සතුටය, ආධ්‍යාත්මික නිදහස ය. ඒ නිසා අපි "අද වැඩ අදට සෑහේ" යන්නෙන් මතක තබා ගෙන නව ආධ්‍යාත්මික නිදහසක් කරා පිය මැනීමට කිතු වරම් පතමු. ගමත් නිදහස්, රටත් නිදහස් නමුත් ඔබත් මමත් කිතු අනුගාමිකයන් ලෙස නිදහස් ද?

**නිදහස සොයමු අප හද පත්ලෙන් -**
**කිතු සමිඳාණන් අනුගාමී වී,**
**රටත් නිදහස්, ගමත් නිදහස් -**
**ඔබත්, මමත් නිදහස් ද ?**

**බුද්ධික සඳරුවන්**
**10-B,** සාන්ත මරියා විදුහල
මීගමුව

# පුංචි විකුම්



සම්පත් එකොළහ වසරේ ඉගෙනුම ලබන දරුවෙකි. දහම් පාසලේ ශිෂ්‍ය නායකයෙකි. පාසලේ කැපී පෙනෙන සිසුවෙකි. පාසලේ, දෙව්මැදුරේ, දහම් පාසලේ බාහිර කටයුතු වලදී නායකත්වය ගෙන කටයුතු කරන අතර , ඕනෑම කටයුත්තකදී සියළු දෙනාම එකතු කරගෙන සාමුහිකව, සුහදව, කටයුතු කිරීමට දක්ෂයෙකි. එනිසා වැඩිහිටියන්ගේත් ගුරුවරුන්ගේත් ප්‍රසාදය ඔහු දිනාගෙන ඇත .

පසුගිය නත්තලට ඔහුගේ මූලිකත්වයෙන් යාළුවන් ටික රැස්කරගෙන අපූරු වැඩක් සංවිධානය කළේය. ඔවුන්ට වුවමනා වුණේ ගමේ පාසල් යන දුප්පත් ළමයින්ට අවශ්‍ය පාසල් පොත් ලබාදීමටය. විශේෂයෙන්ම කිව යුත්තේ ඒ ප්‍රදේශය දිළිඳු ධීවරයන් වසන ප්‍රදේශයක් බවයි. ඔවුන්ගේ මේ කටයුත්ත සඳහා මුදල් සොයා ගැනීම පිණිස නොයෙක් යෝජනා සාකච්ඡා විය. අවසානයේ ඔවුන්ගේ තීරණය වූයේ කැරොල් කණ්ඩායමක් පුහුණු කරවා ගෙන නත්තලට ගමවටා කැරොල් යන්නත් , ගෙන්ගෙට ගොස් ඉවතලන පොල්කටු එකතුකරගෙන අලෙවි කිරීමටත්ය. සියලු දෙනාගේම එකඟත්වයෙන් එය ක්‍රියාත්මක කළ අතර ගමේ වැඩිහිටියන් ගෙන්ද, ඒ වගේම සංචාරක හෝටල් වලින්ද ඔවුන්ට උපරිම සහය ලැබුණි. එමනිසා සෑහෙන මුදලක් ඔවුන්ට සොයා ගැනීමට හැකිවිය.

ඔවුහු දහම් පාසල බාර පැවිදි සොහොයුරියගේ සහ දහම් පාසල් ගුරු මණ්ඩලයේ සහයෙන් ආධාර කළ යුතු දරු පිරිස තෝරාගන්නා ලදී. ඒ අනුව පසුගිය දෙසැම්බර් 29 වන දා මීසම් සේවක පියතුමාගේ ප්‍රධානත්වයෙන් පුංචි උත්සවයක් සංවිධානය කර පාසල් පොත් බෙදා දෙන ලදී.

උත්සවය අවසානයේ පුංචි අනුශාසනාවක් කළ ගරු පියතුමා කියා සිටියේ එම යහපත් ක්‍රියාවට මූලිකව දායක වී එය සංවිධානය කළ සම්පත්ටත්, මේ දරු කැලටත් ස්තුතිය පුද කරන බවයි. එසේම මෙම සත්ක්‍රියාව ගමේ අනික් දරුවන්ට මෙන්ම වැඩිහිටියන්ටද මහඟු ආදර්ශයක් වන බවයි.

ආදර දුවේ පුතේ, සම්පත් ඇතුළු කණ්ඩායම වගේ සමාජයට වැඩදායක දෙයක් කරන්නට පුංචි කාලයේ ඉඳලම පුරුදු පුහුණු වුවොත් ලස්සන රටක් ලස්සන ලෝකයක් ගොඩනගන්නට ඔබට හැකිවේවි.


**සූරිය මාමා**

## ආදරණීය දරුවනි,

"ළමා ප්‍රබෝධනය" ට
ඔබගේ ලස්සන නිර්මාණ
**කවි** / **ගීත** / **නිසඳැස්** /
**කෙටි කතා** / **ලිපි** / **සිතුවිලි**
ආදි වශයෙන් ලබා ගැනීමට,
අපි බොහොම කැමැත්තෙන් සිටිමු.
**පන්තිභාර ගුරුතුමාගේ** /
**ගුරුතුමියගේ අත්සන ඇතිව**
ඒ නිර්මාණ අප වෙත යොමු කරන්න.

**සංස්කාරක පියතුමා,**
**"භක්ති ප්‍රබෝධනය",**
**අංක 265, ඩීන්ස් පාර, මරදාන,**
**කොළඹ 10.**

# ප්‍රහේලිකා අංක - 57




ඔබගේ පිළිතුර තැපැල්පතක පමණක් ලියා පහත ලිපිනයට, 2020 පෙබවාරි 29 ට පෙර තැපැල් කරන්න. ජයග්‍රාහකයින් අතුරින් තෝරා ගත් **තිදෙනකුට මුදලින් තෑගි පිළිවලින්,** රු.1000.00, රු. 750.00, රු. 500.00 බැගින් පිරිනැමේ.

**විශේෂ මතක් කිරීමක් -**

ප්‍රහේලිකාවේ විසඳුම් එවන විට ඔබේ නම, පන්තිය, පාසල හා පාසලේ ලිපිනය සඳහන් කර එවන්න.

ප්‍රහේලිකා අංක - 56
"ළමා ප්‍රබෝධනය".
අංක 265,
ඩීන්ස් පාර, මරදාන,
කොළඹ 10.

**හරහට**

1. පරණ ගිවිසුමේ දේව මන්දිරය පිහිටි නගරයයි.
3. අඩි තුන යාරය නම් අඩි එකහමාර කීයද?
5. අල වර්ගයකි.
6. කාන්තා නාමයකි, ඇඳුනොත් සම්පතකි.
7. ආයුර්වේද ඖෂධයකි, විශේෂයෙන් පත්තු සඳහා ප්‍රයෝජනයට ගැනේ.
9. ලෝ ප්‍රකට අන්තිම රාත්‍රී භෝජනය, මොනාලිසා චිත්‍ර ඇන්ද චිත්‍ර ශිල්පියාගේ නමේ දෙවන පදයයි.
12. ලෝකයෙන් මෙය ඉවත් කළ හොත් සග සැපත මෙලොව දීම අත්විඳිය හැක.
14. මේ පලතුරේ මිහිර දැනෙන විට කොස් මාමා මතක් වෙයි.
15. මෙහි දෙපැත්තක් ඇත, මුදල් ගණුදෙනුවේ ද හුවමාරු වේ.

**පහළට**

1. ජේසුගේ දුක් ප්‍රාප්තිය මෙතනින් පටන්ගෙන කල්වාරියෙන් නිමා විය.
2. පසුගියදා පැවති දකුණු ආසියාතික ක්‍රීඩා උළෙලේ දී මේ ඉසව්ව සඳහා අපේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට පදක්කම් රාශියක් දිනා ගැනීමට හැකි විය.
3. වානර වර්ගයට අයත් මේ සතා පුරුදු පුහුණු කර මුදල් උපයා ගැනීමට යොදා ගැනේ.
4. ලීලයි, කමලයි, චම්පයි, රේබයි, බාහුමතියි ළඟ ඉන්නේ මෙයයි.
5. මේ දිනවල පාරිභෝගික භාණ්ඩ වල මිල අඩුකිරීම සඳහා මේවා ඉවත් කරයි.
8. මෙයට සාප කරමුද, එක් ඉටිපහනක් දල්වමුද?
10. මෙයට ගිනි දැල්වීම කෙරෙන්නේ චාරිත්‍රානුකූලවය.
11. අපාත් නෙමේ නම් සිව්පාත් නෙමේ නම් මෙය කිමෙක්දැයි හඳුන්වන්න.
13. "මගේ අවුස්සගන්න" එපා යැයි තරහ ගියවිට සමහරු කියති.

**සැකසුම : ගරු. ලක්මාලි ප්‍රනාන්දු**
**පැවිදි සොහොයුරිය ශු.ප.**
ශු.පවුලේ පැවිදි ආරාමය,
කමරගොඩ.

# සැබෑ සිත් හැරීමක් තුළ ශුද්ධවන්ත දිවියක් ගත කළ ශු. පෙරිග්‍රීනු මුනිතුමා

ඉතාලියේ උතුරු කරයේ පිහිටි ෆොර්ම් නම් වූ ගමක විසූ ධනවත් පවුලක එකම දරුවා ලෙස " පෙරිග්‍රීන් ලැම්සියෝසි" වර්ෂ 1260 දී උපත ලැබීය. එවකට පැවති ආගම් විරෝධී වාතාවරණය තුළ මෙම පවුල ඇතුළු ඒ ප්‍රාන්තයේ විසූ මුළු මහත් ජනතාව ක්‍රිස්තියානි ධර්මයටත් පැවිදි පූජකතුමන්ලාටත් අහේතුවක් ලෙස එදිරි වූහ.

එවකට සිටි ශුද්ධෝත්තම පියතුමා මේ දරුණු අභියෝගයට විසඳුමක් ලෙස කුමක් කරන්නදැයි කල්පනා කළහ. ධර්මය හරිහැටි පහදා දීමෙන් ගතානුගතිකත්වයට නැඹුරු වූ මිනිසුන්ගේ සිත් නැවත දෙවිඳුන් වෙත හරවා ගැනීමේ අදහසින් ධර්මදූත පිරිසක් එහි යැවූහ. යවන ලද දූත පිරිසේ නායකයා වූයේ ,පිලිප් බෙන්සි නැමති පැවිදි පියතුමාය.

ජනතාව උන්වහන්සේගේ බුද්ධිමත් වූද තර්කානුකූල වූද දේශනා කෙරෙහි පැහැදී සාවධානව ඇහුම්කන් දීමට පටන් ගත්හ. තවද ලබා ගත් නව දැක්ම ඇතුළු කර ගත්හ. දිනක් නොසිතූ දෙයක් සිදු විය. පෙරිග්‍රීන් නම් දාමරික තරුණයා තම මැරවර තරුණ කණ්ඩායම පිරිවරාගෙන දහම් දෙසුමට කන් යොමා සිටි පිරිස මැදට කඩා වැටුණේය. ශාන්ත පිලිප් පෙන්සි තුමාව තර්ජනාත්මකව වේදිකාවෙන් ඉවතට ඇද දැමීය. මැරවරයන් ගුටි බැට දෙමින් පිරිස විසිරුවා හරිද්දී, පෙරිග්‍රීන් අන් සැමට වඩා බාහු බලය පාමින් ශු. පිලිප් තුමාට කම්මුලට පහර දෙන්නට විය. පහරින් පහර අනෙක් කම්මුල දුන් ශු. පිලිප් තුමා තරුණයා කරන වරදට වහාම සමාව දානය කළේය. ඒ ශුද්ධාශීලී ප්‍රතිචාරය පෙරිග්‍රීන්ගේ දැඩි සිත මෙල්ල කර මෘදු කිරීමට සමත් විය. තම වරද දුටු පෙරිග්‍රීන් ශු. පිලිප් තුමා පසුපස ගොස් සමාව ඉල්ලා සිටියේය. ඉන් ඉදිරියට තමාගේ සහචරයන් වෙත ඔහු හැරී නොගියේය.

හුදෙකලා බව අගය කරන්නට පටන්ගත් එතුමා යාච්ඤාවෙන් කාලය ගත කිරීමට ඉටා ගති. දිනක් දැහැන්ගත වී ඉන්නා විට මරියතුමී ඔහුට දර්ශනය වී "සයෙනා" නගරයට යන්නැයි කිවූහ. එහිදී ඔහු එවකට පැවති "නිමල මරියාවන්ගේ දාසයෝ" නම් ලත් පැවිදි කණ්ඩායමට එක්විය. ඔහු සාදරයෙන් පිළිගත් ඒ නිකායේ නායක තුමා ඔහු අතින් අසාධාරණ ලෙස කම්මුල් පහර කෑ ගරු පිලිප් බෙන්සි පියතුමා විය. **තමන් ගතකළ පාපිතර ජීවිතය ආවර්ජනය කරමින් පෙරිග්‍රීන් නම් වූ තාපස තුමා සම්පූර්ණ සිත් හැරීමේ වරම දයාබර දෙවිඳුන් අතින්ම ලබා ගති.** පාප වන්දි වශයෙන් එතුමා තමන්ටම යෝජනා කරගත් තාපස ක්‍රියාව නම්, වාඩි වීම අත්‍යවශ්‍ය නොවන හැම විටකදීම හිටගෙන සිටීමයි. පුරා අවුරුදු 30 ක් මුළුල්ලේ උන්වහන්සේ වාඩි නොවී සිටගන සිටි බැවින් උන්වහන්සේගේ දෙපාවල ලේ නහර ගැට ගැසීමෙන් රුධිර ධාවනයට බාධා වූ බැවින් කකුල්වල වණ හට ගැනිණ. ඒවා කඩිනමින් පිළිකා බවට හැරිණි. වෛද්‍යවරුන්ගේ මතය වූයේ උන්වහන්සේගේ කකුල් ශෛල්‍යකර්ම මඟින් කපා දැමීමය. දැඩි කායික හා මානසික වේදනාවෙන් පසුවූ පෙරිග්‍රීන් තුමා, සකල දුක්ගාවිනා තමන්ගේත් අන් අයගේත් පාපවලට වන්දි වශයෙන් විඳ දරාගත්තේ කෙඳිරිගෑම් වලින් හා මැසිවිලි වලින් තොරවය.

ශෛල්‍යකර්ම සඳහා දින නියම විය. පෙරිග්‍රීන් තුමා දෙකකුල් තමන් පසුපස ඇදගෙන යන්නාක් මෙන් බිම දිගේ ඇදෙමින් මහා පරිශ්‍රමයකින් ශ්‍රී කුරුසියේ ප්‍රතිමාව කරා ගොස් මුනින් තලා වැටී යාච්ඤාවේ යෙදී සිටියහ. පැය කිහිපයක් එතුමා නින්දට වැටිණි. පෙරිග්‍රීනුතුමාට ජේසුස් වහන්සේ දර්ශනය විය. උන්වහන්සේ පහත් වී පෙරිග්‍රීන් තුමන්ගේ පිළිකා සහිත දෙපා දයාභරිතව ස්පර්ශ කරනු දුටුවේය. රැය ගෙවී උදය උදාවන තුරු එතැනම නින්දේ පසුවූ එතුමා අවදිවෙත්ම තමාගේ දෙපා සම්පූර්ණයෙන්ම සුව වී සිනිඳු සමකින් වැසී ඇති බව දුටුවේය.

1726 මැයි මස 1 දින උන්වහන්සේ නිල වශයෙන් ශුද්ධවරයට ඔසවනු ලැබීය. මෙතුමා වණ තුවාල පමණක් නොව පිළිකා රෝගයෙන් පෙළෙන්නන්ගේ ආරක්ෂක මුනිවරයා ලෙස සභාව තුළ ගරු බුහුමන් ලබන්නේය.

**ගරු. ලක්මාලි ප්‍රනාන්දු**
**පැවිදි සොහොයුරිය ශු.ප.**
ශු.පවුලේ පැවිදි ආරාමය, කමරගොඩ.

# මළ මුහුද සහ සොදොම් ගොමෝරා

අද අප ඔබ කැඳවාගෙන යන මුහුදු මට්ටමේ සිට බලන විට මිහිමත පහත්ම ස්ථානය වන මළ මුහුද, අධිකතර ලවණතාවයකින් යුක්ත කිසිදු ජීවයෙකු නොවසන විලකි. ජොර්දාන් ගඟෙන් පෝෂණය ලබන මළ මුහුද, බටහිර වෙරළ ඊශ්‍රායෙලයටද, නැගෙනහිර ඉවුර ජොර්දානයටද වන ලෙස මැදිව පිහිටා ඇත. මුහුදු මට්ටමින් මීටර් 430.5 ක් පහතින් පිහිටා ඇති අතර වර්ග කි.මී. 605 ක් වපසරියකින් යුක්තය. ලවණතාව සාමාන්‍ය සාගරයට වඩා 8.6 ගුණයකින් වැඩිය. සැතපුම් 60 ක දිගින්ද සැතපුම් 13 ක පළලින්ද යුතු මළ මුහුද සල්පර්, අයඩින් හා පොටෑසියම් ඇතුළු ඛණිජ ද්‍රව්‍ය රැසකින් සමන්විත බැවින් කිසිදු ප්‍රාණියකුට එහි ජීවත් විය නොහැකිය. වැඩිම ගැඹුරු ස්ථානය මීටර් 298 කි.

ශුද්ධ බයිබලයේ කිසිදු ස්ථානයක මළ මුහුද පිළිබඳව නමින් සඳහන් නොවෙතත් පුරාණ ගිවිසුමේ **උත්පත්ති පොතේ 19:23-26** හි සඳහන් සොදොම් සහ ගොමෝරා නගර මේ ආසන්නයේම පිහිටා තිබෙන්නට ඇති බව විශ්වාස කෙරේ. සොදොම් සහ ගොමෝරා වාසීන් ගත කළ අති පාපිෂ්ඨ ජීවිතය නිසා දෙවියන් වහන්සේ විසින් එම නගර විනාශ කළ පුවත උත්පත්ති පොතේ මෙලෙස දක්වා තිබේ. " **එවිට ස්වාමින් වහන්සේ සොදොම් සහ ගොමෝරා නගර පිට අහසින් ගෙන්දගම් සහ ගිනි වර්ෂා වහින්නට සැලැස්වූ සේක. උන්වහන්සේ ඒ නගර ද මුළු මිටියාවත් ද නගරවැසි හැම දෙනාද පොළොවේ ගස් කොළන් ද විනාශ කර දැමූ සේක. ලොත්ගේ භාර්යාව ආපසු හැරී බැලුවාය. එවෙලේම ඇය ලුණු කණුවක් වූවාය " (උත්පත්ති 19:23-26).** මෙම පැරණි නගර විනාශයට පත් කරන ලද බැවින් අද දක්නට නැතත් ලොත්ගේ ලුණු කණුව ලෙස හැඳින්වෙන කුලුණක් දැක ගැනීමට ශේෂව තිබේ.

මළ මුහුදේ ඇති ඛණිජවල රෝග සුව කිරීමේ හා සම පැහැපත් කිරීමේ ශක්තිය ඇති බව සඳහන්ය. එනිසා එම ඛණිජවලින් සුවඳ විලවුන් රූපලාවණ්‍ය ද්‍රව්‍ය නිෂ්පාදනය සිදු කරන අතර මුහුද මත නොගිලී පාවෙන සංචාරකයන් ගොඩබිමට පැමිණ මළ මුහුදේ මඩ සිරුර පුරා තවරා ගනු දක්නට ලැබේ. එයින් රෝග සමනය වන බවට විශ්වාසයක් පවතී.

**කැලිස්ටස් ජයමාන්න**



# "ඈ"

පොඩි නැන්දා බැලීමට අප ඇගේ නිවසට ගොස් ගත වූයේ නොබෝ වේලාවකි. ඈ අපට බීමට තැඹිලි වතුර පිළිගන්වන්නේ ගෙඩියේ ඇස්ස කපා දමමිනි.

තැඹිලි ගස යට සිටින අපට, "මේ ගහ හිටෙව්වේ මගේ උපන් දිනේකට" ඈ ආඩම්බරයෙන් කියන්නීය.

"උපන් දිනේට?" මගේ දරුවෝ එකවරම ප්‍රශ්න කරති.

"ඔව් පුතේ, ඒ දවස වටිනා දවසක් කරන්න ඕනෑ එහෙමයි." නැන්දාගේ කතාවේ ගැඹුරක් ඇති බව අපට දැනේ. "මේ රන් තැඹිලි තියෙන්නෙ අපේ රටේ විතරයි."

ඈ තැඹිලි කෝම්බ කපා පොළොවට යට කරන ගමන් කියන්නීය. "තැඹිලි වතුර අපූරුයි. අපි දෙන්නගෙම උපන් දින ලබන මාසෙ. අපිත් එදාට පැළයක් හිටවමු." "මගේ දුවගේ අළුත් යෝජනාව පුතාටය."

"අර තියෙන්නෙ පැළ තවාන, තැග්ග මම දෙන්නම් " පොඩි නැන්දා නම් අපූරු ගැහැණියකි......

පාසල් යාමේ පහසුව සලකා මාද කුඩා කාලයේ මෙහි නතර කර ගත්තේ ඇයයි. දරු දෙදෙනකු ඇයට සිටියත් මාද ඇයට දරුවෙක් විය. මගේ දරුවන් කැටුව මා අද ආවේද අම්මා නැති මට මව වූ ඇයට කෙළෙහි ගුණ දැක්වීමක් වශයෙනි.

ඒ දිනවල අප සැමට ආහාර පාන ඉඳුම් හිටුම් සියලු පහසුකම් සැපයූ වේ ඇයයි.

ගෙයි සිටින - රස්සාවක් නොකරන ගැහැණිය - "අම්ම මොකද කරන්නෙ" "ගෙදර නිකං ඉන්නවා"

එක මොහොතක විවේකයක් නැති ඇය ගෘහණියයි. උයන පිහන, රෙදි සෝදන, ගෙමිදුල් අතු ගාන, පොළට යන බඩු ගේන, දරුවන්ට බෙහෙත් හදන ඇය -

"අම්මෙ - බඩගිනියි" - පිසූ දේ දරුවන්ට බෙදා දී දන්කුඩ බුදින ගෘහණිය - ඇයයි -



"ළමයින්ට ගහන්න බනින්න එපා ආදරෙන් කියලා හදා ගන්න ඕනෑ" පොඩි නැන්දා විටෙක මටද කනට කර කියා ඇත. කෙළි සෙල්ලමට කැමති අපේ ළමා කාලය සැලසුම් කර දුන්නේ ඇයයි. "ළමයිනේ දවසට පැය කීයක් තියනවද?" "විසි හතරයි" අප තරඟයට කෑ ගසා කියා ඇත. විනාඩි හැටයි තත්පර හැටයි.

"ළමයිනේ දවසට තත්පර කීයද? " පොඩි නැන්දාගේ ගණිත ගැටලුවට අප ළඟ පිළිතුර ඇත. තත්පර 8640 යි. "හොඳයි ඔයාලා දවසට තත්පර කීයක් නාස්ති කරනවද? "අප සැමට තරු පෙනුණේ ඒ වෙලේය.

එදා දරුවන් වූ අප කාල කළමනාකරණය ගැන සිතුවේ එතැන් සිටය. එහි ප්‍රතිඵල අපි අද භුක්ති විඳිමු ........

"දරුවනේ ඇඳුම පිරිසිදු වුනාට මදි. ප්‍රධාන දේ හිත පිරිසිදුව තියා ගැනීමයි." අපේ රෙදි සෝදමින් නැන්දා එදා කී වදන් ගලේ කෙටූ අකුරු මෙන් මගේ මතකයේ පවතී. හිත කිළුටු වන දේ සිදුවන විට මට පොඩි නැන්දා සිහිවේ. ඇය අපට බැන වැදී නැත. "අරක එපා""මේක එපා" කීවේද නැත. නමුත් සිතට කාවදින ලෙස ඇය නිහඬව කී දේ ජීවිත කාලය පුරා අපට ප්‍රයෝජනවත් වී ඇත.

ඈ කදිම ගැහැණියකි. අපූරු ගෘහණියකි. ඇගේ ගැඹුරු අධ්‍යාත්මය අදත් ඈ අපට බෙදා දෙමින් සිටින්නීය.

**ඩබ්.ඩී. මැටිල්ඩා අධිකාරම්**
තලාව

# අපි ඔක්කොම රජවරු ඔක්කොම වැසියෝ තුන් සිංහලයම......?

පෙබරවාරි මස හතරවන දින හිමිදිරියේ ගුවන් විදුලියෙන් අපට ඇසෙන්නේ දේශාභිමානි ගීත ය. ජාතික වීරයන් ගේ චරිතාපදන යි. නිදහස පිළිබඳ චින්තන කියමන්ය. ඒ අතර විශේෂ විකාශනයකින් කියැවෙන්නේ "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමානවත් නිදහස සැමරීම වෙනුවෙන් අද අප ඔබ හා .................." ආදී වශයෙන් යම් නිවේදනයකි. එයින් අපට හැඟෙන්නේ උදාරතර සැමරුම් සමුදයකි.

නිදහසක් ලබා ගැනීමට වෙහෙසෙන්නේ රටවල් හා ජාතීන් පමණක් නොව එක් එක් පුද්ගලයෝ ද නිදහස සොයති. ඒ වෙනුවෙන් ඇපවෙති කැපවෙති වැයවෙති. ලබාගත් නිදහස ප්‍රීතිමත් ද නැත් ද ඔවුන් විමසා බලති.

රටක් වශයෙන් ජාතියක් වශයෙන් අපි නිදහස ලද්දෝ වෙමු. එක්දහස් නවසිය හතළිස් අටේ පෙබරවාරි මස හතර වනදා මේ මව් බිමේ අපි නිදහස් රටවැසියෝ වූයෙමු.

අපි අපේම ජාතික ගීයක් නිර්මාණය කර ගත්තෙමු. එහි ගණ පිහිටීමේ දෝෂ මකා දමා අපට ජාතික ගීය රචනා කර දුන් ආනන්ද සමරකෝන් සූරින් මරා ගත්තෙමු.

අපි ජාතික ධජයක් නිර්මාණය කළෙමු. එහි තීරු දෙකක් සුළු ජාතීන් යැයි කියන පිරිසක් සඳහා වෙන් කළෙමු.

සුළු ආගමිකයන් ලෙස හැඳින්වීමක් නැතත් පාස්කු ඉරිදු බෝම්බ මාලාව එල්ල වුයේ අප සුළු ආගමිකයන් කොටසක් ලෙස සලකා ගෙන දැයි යන සැකයක් මතුවේ. ඒ කෲර මිනීමරුවන් මෙහෙය වූවෝ කවුරුදැයි කියා රට ම බලා සිටියි.

බාප්පලා වෙනස් වුවද කුඩම්මා ගේ සැලකිල්ල නම් සුපුරුදු ලෙසම පවතී.

ලොව පරසිඳු වු ශ්‍රී ලංකාවේ පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරය සිදු වූයේ අනපේක්ෂිත මොහොතකය. කිතුනුවන් ගේ උත්තම ආධ්‍යාත්මික මංගල්‍යය සිදුකරන දවසේදී ය.

නිදහස් ශ්‍රී ලංකාවේ 72 වන සංවත්සරය සමරණ විට ස්වාභාවික විපත් වන භූමිකම්පා, සුනාමි, සුළි සුළං, නායයාම්, ගංවතුර ආදි වශයෙන් අවස්ථා ගණනාවකදී මිනිස්සු මරණයට පත්වූහ.

එල් ටී ටී ඊ සංවිධානය හා ශ්‍රී ලංකා හමුදාව අතර පැවැති සන්නද්ධ අරගලයේ ප්‍රතිඵල ලෙස ද දිනකට සිය ගණනක් මිනිසුන් මරණයට පත් වූහ. ඒ ඒ වකවානු ඉතිහාසයේ සටහන් වූයේ හේතු සහගතවය.

ශ්‍රී ලංකාව මෙන්ම ලෝක බලවතුන් ද තිගැස්මකට ලක් කළ මිනීමරු කොටි ත්‍රස්තවාදය මේ ලක් පොළවේ දූළි අතර මුසු කොට දස වසරකට ආසන්න විය. ජාතීන් අතර ආගම් අතර සංස්කෘතින් අතර පැවතුනේ සාමයකි. සමගියකි. මහාචාර්ය සුනිල් ආරියරත්නයන් පබැඳූ විශාරද වික්ටර් රත්නායකයන් ගායනා කරන "අපි ඔක්කොම රජවරු ඔක්කොම වැසියෝ තුන් සිංහලයම නැදැයෝ අපි ඔක්කොම පියවරු ඔක්කොම මව්වරු තුන්සිංහලයම දූ දරුවෝ" කියමින් ගයමින් උදන් ඇනුවේ අපේ ජාතික නිදහස මුදුන් මල්කඩක් සේ සලකා ගෙනය. එහෙත් අද ..... මේ දැන් වන විට ඒ ගැයූ තුන්සිංහලයට යළි බියක් සැකයක් ඉපදී ඇත. නැත්නම් උපද්ද ඇත. තවත් සරලව දැක්වුවහොත් අපේ නිදහස කොටි අතකින් නොව බළල් අතකින් සූරා පලුඳු කර ඇත.

මේ බළල් අත මතු වුයේ කොතැනින් ද? මේ බළල් අත කාගේ වුවමනාවකට හසුරුවන ලද්දේ දැයි අප නිතර විමසිල්ලෙන් සිටින්නේ නිදහස අගයන නිදහස අවැසි රටක් ජාතියක් වශයෙනි.

**ශ්‍රී ලංකා අප ස්වාමිඳුගේ මංගල්‍යය අපට රටට ජාතික මංගල්‍යයකි. ජපනුන් විසින් නසන්නට සැලසුම් කළ මේ රට දේව හස්තයෙන් රක්ෂා කොට දේවමාතා යැඳුමෙන් පාරිශුද්ධ කළ සේක. යළි යළිත් දෙවි මවුන් නමට මේ උතුම් පුන්‍ය භූමිය කැප කරන ලද්දේ මෙරට කිතුනුවන් ගේ ධාර්මික අධිෂ්ඨාන පූජාවේ පාරමිතා බලයෙනි. අප ජාතික වශයෙන් මෙන්ම ආත්මික වශයෙන් ද තුන් සිංහලයේ නෑදැයෝ වම් හ. මන්ද නිදහස දේව වරප්‍රසාදයකි. දේව දීමනාවකි. දේව හස්තයේ උත්තම සම්පතකි.**

**මංගල ජයවර්ධන**
ගිංතොට

# වපුරන්නෙක් වපුරන්නට ගියේය

වපුරන්නාගේ උපමාව ඇතැම් විට මේ වන විට සිය වාරයක් වැඩහිටි අප අසා ඇත. එමෙන්ම සිතින් වචනයෙන් ක්‍රියාවෙන් සහ අතපසු කිරීමෙන් යන වචන ඊටත් වඩා වාර ගණනක් පපුවට ගසා ගනිමින් උච්චාරණය කර ඇත. මේ වචන හතර හා වපුරන්නාගේ උපමාව අතර සම්බන්ධයක් මං දකිනවා. ඔහු වපුරන කල මෙසේ සිදුවිය. **"බීජ සමහරක් මඟ දිගේ වැටිණි. සමහරක් පස තුනී ගල් බිම්වල වැටිණි. සමහරක් කටු ගස් අතර වැටිණි. සමහරක් සරු බිමෙහි වැටිණි" (මතෙව් 13:4-6).**

උපමාවේ වපුරන්නා ජේසු ස්වාමි දරුවෝය. වර්තමානයේ වපුරන්නා දේශකයාය. බීජ දේව වචනයයි. වපුරන්නාට බිම විවිධ වූවා සේ අද දේශකයාටද මිනිස් සිත විවිධය. වපුරන්නා වැපිරූ බීජ මඟ දිගේ ගල් බිම් වල, කටු අතර හා සරු බිමේ වැටිණි. අද ද එසේම ය. පූජාව ආරම්භයේදී "දහසක් සිතුවිලි පසෙක තබා...." යන ගීතිකාව ගායනා කළත් සහභාගි වන අය දහසක් සිතුවිලි හිසේ තබාගෙන සිටිති. අයෙක් දිව්‍ය පූජාවට සහභාගි වන්නේ පණතින් බේරෙන්නටය. සමහර අය සුවාමිගේ කරදරයෙන් බේරෙන්නටය. ඇතැමෙක් දස පණතේ ණය යුක්තිය ඉටු කරන්නට නොව තමන්ගේ ණය තුරුස් වලින් බේරා දෙන්නට කියා දෙවියන් වහන්සේට මොර ගසන්නටය. තම ස්වාමියාගේ බේබදුකම නවත්වන්නට කියා දෙවියන්ට පෙරත්ත කරන්නටය. තමන්ගේ හෝ දරුවන්ගේ රෝගී තත්ත්වය අහවර කරන්න කියා කන්නලව් කරන්නය. තවත් කෙනෙක් තම දරුවාගේ විභාගය ඉහළින් සමත් කරදෙන්න කියා දෙවියන් වහන්සේට යදින්නටය. තවත් මවක් කන්නලව් කරන්නේ තම රස්තියාදුකාර දරුවාට රක්ෂාවක් සොයා දෙන්න කියා ය. මෙවැනි සිතුවිලි ගණනාවක් සිතේ තබාගන දිව්‍ය පූජාවට සහභාගි වෙද්දී දේශකයා උගුර කඩාගෙන කෑ ගැහුවත් දේව වචනය විවිධ බිම්වල වැටේ.

බහුතරයක් ශ්‍රාවකයන් දේශකයාගේ දේව **වචනය සිතින් පිළිගනී. නමුත් වචනය මඟ දිගේ හෝ කටු අතර හෝ ගල් බිමේ වැටේ. දේශකයා සාරවත් දේශනයක් කළත් සරුබිමක වැටෙන්නේ අතළොස්සක්ය. සිතින් පිළිගත්තද, හදවතින් දේව වචනය සමහර අයට තම කරදර අස්සේ, මහත් හිසරදයකි. "කොයි වේලේ මේ දේශනය හා පූජාව ඉවර වෙයිද? ....." කියා සිතති.** පොල් ගසක් යටට වී පත්තරය කියවන්නෝ හෝ තවත් කෙනකු සමඟ පොල් ගණන් හෝ එළවළු හෝ මාළු ගණන් විමසන්නෝ කෙළින්ම සිත් දැඩි කරගන සිටිති. **"ඔබ අස අසාත් තේරුම් නොගන්නාහුය. දැක දැකත් නොදක්නාහුය. මේ සෙනඟගේ සිත් අඳුරුය. ඔවුන්ගේ කන් වැසී ඇත. ඔවුන්ගේ දෑස් පියවී ඇත...." (මතෙව් 13:14-15).** යෙසායා පවසා ඇත්තේ මෙවන්නන් ගැනය. සමහරු දිව්‍ය පූජාවට සහභාගී වන්නේ ත්‍රීවිලරයේ ඇතුළේ සිට හෝ මෝටර් සයිකලයේ ආසනය මත සිටය. මෙවැන්නන් මඟ දිගේ වැටුණු බීජයන්ට සමානය. නොයෙක් සිතුවිලි සිතේ තබාගෙන සහභාගි වන්නන් කටු පඳුරු අතරේ වැටුණු බීජයන්ට බොහෝ දුරට සමානය. පියතුමා දෙසන අයට අතරින් පතර යමක් ඇහුණත් විවිධ ප්‍රශ්න නිසා පළදරන්නේ නැත. ගල් බිමේ වැටුණු බීජද ඒ හා සමානය. යම් පණිවුඩයක් හදවතට



ගන්නේ නැත. ක්‍රියාවට නඟන්නට කෙසේවත් ඉඩක් නැත. ප්‍රශ්නය අතපසු කිරීමය. ක්‍රියාවට නැංවීමට හොඳ හිත තිබුණද එය අතපසු වේ. වචනය ශ්‍රවණය කිරීම එක් දෙයකි. එය ක්‍රියාවට නැංවීම තව දෙයකි. ක්‍රියාවට නැංවීමට නම් දේව වචනය අයිති කරගත යුතුය. ඒ අතින් බලන කල මුලින්ම වචනය ඇසිය යුතුය. දෙවනුව එය අයිති කරගත යුතුය. තෙවනුව එය ක්‍රියාත්මක කළ යුතුය.

මුල් පියවර දෙස බලද්දී දේව වචනය බෙදා දෙන අය, ක්‍රමානුකූලව එය දිය යුතුය. එය දේශකයාගේ යුතුකමය. **"දේශනා කිරීමට සූදානම් වීම ඉතාම වැදගත්ය. ඒ තුළ ගැඹුරු අධ්‍යයනය, යාච්ඤාව, භාවනාව හා එබඳු නිර්මාණශීලී බව අඩංගු විය යුතුය. සූදානම් නොවන දේශකයා ප්‍රශස්ත ආධ්‍යාත්මයක් ඇත්තකු නොවේ. ඔහු වංක හා ඔහුට ලැබුණු දායාද කෙරෙහි වගකීමක් නොමැත්තෙකි" (සුපුවතේ ආනන්දය අංක 145).** දේව වචනය වැපිරීම හරියාකාර කළොත් අස්වැන්න සශ්‍රීක විය හැක. **"ගොයම නම් බහුලය. ගොවීහු නම් විරලය. එබැවින් ගොයම් කැපීමට මෙහෙකරුවන් එවන මෙන් යාච්ඤා කරන්න" (ලූක් 10:2).** සමහර දේශකයන් ගැන මෙහෙම ඇතැම් අය කියනවා මං අසා තිබෙනවා. එතුමාට පුළුවන් ඇතුළේ ඉන්න අයට එළියට යන්න. දේශනා කරන්න, එළියේ ඉන්න අයට ඇතුළට එන්න දේශනා කරන්න. වපුරන්නන් ගණනින් නොව වගකීමෙන් යුතු අය විය යුතුය. සමහර විට මෙහෙමත් කියනු මා අසා ඇත. ඔය මොනව හරි මොනව ගැන හෝ කියන්න.... මේ සූදානමක් නැති අයකුගේ කියමනකි. දේව වචනය වපුරන්නා ගැනය ඒ.

දෙවන පියවර රඳා පවතින්නේ අසන්නා වෙතය. අසන්නා සිහි බුද්ධියෙන් ඇසිය යුතුය. **"සවන් ඇත්තෝ සවන් දෙත්වා" (මතෙව් 13:9) "දේශනය ජන මාධ්‍ය තුළ විනෝදය උපදවමින් ඉදිරිපත් කරනු ලබන ආකාරයේ වැඩසටහනක් නොවිය යුතුය. දේශකයා හට ශ්‍රාවකයාගේ අවධානය විසිරයාමට ඉඩ නොදී ඔවුන්ගේ අවධානය පූර්ණව තබා ගැනීමට හැකියාවක් තිබිය යුතුය. දෙසුම වඩාත් දීර්ඝ නොවිය යුතුය" (සුපුවතේ ආනන්දය 138).** මෙහිදී දේව වන්දනාව තුළ දෙසුම ගැනය, ශුද්ධෝත්තම පියතුමා සඳහන් කරන්නේ. පණිවුඩය උරා ගැනීමට හා අයිති කරගැනීමට එය සාරවත් විය යුතුය.

ශ්‍රාවකයන්ගේ දිරි ගන්වන විවේචන අවශ්‍යය. මුනිච්චාවට කරන විවේචන නොවේ. දේශනය දේශපාලන වේදිකාවක් කර නොගත යුතුය. ශ්‍රාවකයන් ද දේශපාලන රැස්වීමට සහභාගි වන්නේ යයි නොසිතිය යුතුය.

තුන්වන පියවර වන්නේ, ක්‍රියාත්මක් වීමය. ක්‍රියාත්මක වීම සඳහා හදවතින් උරාගත් පණිවුඩයක් තිබිය යුතුය. පියතුමා යන්න **"සාමය ගෙන යන්න."** කියද්දී ගෙන යාමට දෙයක් තිබිය යුතුය. හදවතේ තැන්පත් වූ දෙයක් එවිටය ක්‍රියාවට නැගිය හැක්කේ නැතහොත් සිදුවන්නේ අතපසු වීමය. **"දෙවියන් වහන්සේගේ වචනය ජීවමානය. ක්‍රියාශීලීය. දෙමුහත් කඩුවකටත් වඩා තියුණුය. ආත්මය ප්‍රාණ වායුවෙන් ද, සන්ධි ඇට මිදුලු වලින්ද වෙන් කරන තරම් විනිවිද යන්නේය" (හෙබ්‍රෙව් 4/12).**

දක්ෂ කොන්ත්‍රාත්කරුවෙක් සිටියා. මුලින් ඇදහිලිවන්තයකුව සිටිය ඔහු කාර්ය බහුලත්වයේ පීඩාව නිසා බීමට ඇබ්බැහි වුණා. කල් නොගොස් ඔහුගේ විවාහ සංස්ථාව දෙදරුවා. ඔහු පවුලෙන් වෙන් වුණා. ව්‍යාපාරය බංකොලොත් වුණා. ඔහුට සිදුවුණු සන්තෑසිය පිළිබඳව කල්පනාවේ යෙදී ගමන් කරද්දී ඔහුගේ කකුල යමක වැදුණා. එය මලකඩ සහිත ඇණයක්. මේ මළකඩ සහිත ඇණය මං වගෙයි. දෙකට තුනට නැමිලා. මලකඩ බැඳිලා. ඔහු ඇණය සාක්කුවේ දමාගෙන ගෙදර ගිහින් ඇණය තැලුවා. ඇද හැරියා. මලකඩ ඉවත් කළා. එය තවත් ඒ හා සමාන අලුත් ඇණයක් ළඟ තිබ්බම නම් වෙනස සොයන්න අමාරු බව ඔහු දැක්කා. මේ මළකඩ ඇණය මම වෙනස් කළා නම් ඇයි මට වෙනස් වෙන්න බැරි. තරමක් තැලුනොත්, පොඩි වුණොත් මට පුළුවන් වෙනස් වෙන්න. ඔහු තීරණයක් ගත්තා. අද ඔහු වෙනස් වී නැවත පවුල හා එක් වුණා. ඔහුගේ ව්‍යාපාර කටයුතු ආරම්භ කළා. මේ වෙනස ඇති කළේ මළකඩ ඇණයක්. මේ ඇණය ඔහු අදත් සාක්කුවේ ගෙන යනවා. එය ඔහුට වෙනස් වීමේ සංකේතයක්.

**ගරු සාර්ටෝ නෝනිස් පියතුමා**
ලංසිගම

# ඕං එහෙනං



නිදහස නිදහස නිදහස සොයමින් සැමදෙන දුවපැන ඇවිදින්නේ
ඒත් නිදහසක් නම් නෑ ලැබුනේ මැසිවිලි දොඩමින් ළතවෙන්නේ
කොඩි එසවෙන්නේ ගීත ගැයෙන්නේ වෙඩිමුර නාදය පැතිරෙන්නේ
අපි නිදහස් බොල රට නිදහස් බොල දපනේ දමාගෙන හිඳපන්නේ

කවුරුන් කීවත් යන්නට දකුණින් වමෙන්ම යන්නයි දඟලන්නේ
පයින්ම යන්නෝ දකුණින් යත්වා කියලයි පත පොතෙ කියවෙන්නේ
පනින්න වෙන්නෝ සුදු ඉර මත්තේ කහඉර දැන් මැකිලා යන්නේ
අපේ නිදහස අපට තියෙනවා දකුණ වමට ඉරි ගහපන්නේ

අපි කන දේ ගැන ඇයිද සොයන්නේ නිදහසෙ කන්නට පුළුවන්නේ
සල්ලි දීලා ඇයි වස විස කන්නේ වහ කනවා යැයි කියවන්නේ
වහ කෑවත් ඇති රුදාව කාටද කියලා සමහරු පවසන්නේ
චැනල් කරන්නට පෝලිම් ගානේ නිදහසේ රවුමක් ගහපන්නේ

ගහගෙන කන්දෙක ඇතුළට ඇබ දෙක රේල් පාරේ ජොලියට යන්නේ
මහමඟ යන්නේ වාහන පදින්නේ වෙන ලෝකෙක උන් තනිවෙන්නේ
කියලා කිව්වොත් එපා කරන්නට මව් පිරිසක් සිහිකරලා දෙන්නේ
නිදහස කනවා වාගෙයි දැක්කම ප්‍රවෘත්ති පෙනෙද්දි සිහිවෙන්නේ

ඇස්, නිය , තොල්, කෙස් පාට කරාලා කොන්ඩය කොටටම කපපන්නේ
කොල්ලො කුරුට්ටොත් ඊට දෙවැනි නෑ කොණ්ඩෙට දෙන වද බලපන්නේ
අරකත්, මේකත් කරාට කරාබුද ඉරිච්ච ඩෙනිමක් ඇඳ ගන්නේ
කාටත් ඇතිවන රුදාව මොකටද අනේ නිදහසයි කියපන්නේ

ගමනක් බිමනක් නිදහසේ යන්නට ලියන්න කියන්න හැකි වෙන්නේ
බිය සැක නොමැතිව කල්ගත කෙරුමට රට තුළ නිදහස ඇතිවෙන්නේ
නිදහස් සිතුවිලි අකුරු කරන්නට බාධා හිරිහැර නොමවන්නේ
එවන් රටක් ගොඩ නගන්න සිතනා පැතුමන් මල්ඵල ගන්වන්නේ

**- සූරිය මාමා - ජෝසප් ඩයස්**

# "දහම් අරුණෝදයක් කරා"

"බෙදා හදා ගැනීමේ සහා නවෝදයක් කරා" තේමාව කරගත් ජාතික ධර්ම සේවා සමුළුව 1995 අප්‍රියෙල් මස, 19-23 දිනවලදී කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණි. එයට වසර 25ක් මේ වර්ෂයට (1995-2020) සපිරේ.

බෙදා හදා ගැනීමේ සභාවක් ගොඩ නැගීමට ලක් කිතු සසුනේ ගිහි පැවිදි හැම ක්ෂේත්‍රයකම ජන හඬ ජන මතය එක්තැන්කොට තීන්දු, තීරණ, යෝජනා අදහස් විවිධ මත වාද, ගැටුම් වාද විවාද මෙහිදී සංකලනය විය. තීන්දු තීරණ, නිගමන රාශියක් ගොඩනැගීය. ඒවා ක්‍රියාත්මක වූවාද? නොවූවාද නොදනිමු. කිතුනු ජන ජීවිතය නම් තාම දෙවිඳුන්, දේව වචනය, සැබෑ කිතු දහම හඳුනාගෙන නොමැති බව නම් පැහැදිලිය.

නිගමන රාශියක් විය. ඒ අතුරින් පැහැදිලි ලෙස ඉස්මතු වූ සැබෑ කිතු දහමේ සංකල්පය මෙසේ ප්‍රබල ලෙස ජනගත වූයේය. **"දේව වචනය නොදැන සිටීම දෙවියන් වහන්සේව නොදැන සිටීම යැයි" ශුද්ධවූ ජෙරම් මුනිතුමා පැහැදිලි ලෙස ප්‍රකාශ කර ඇත.** දෙවිඳුන්ට ළං වන්නේ කෙසේද? මනුෂ්‍යයන් දේව සබඳතාවට පැමිණවීමේ මාර්ගය මුල සිට අග දක්වාම ඇදහිල්ලෙන් වන බව දැන් සුභ අස්න නිසා එළිදරව් වී ඇත. **ශුද්ධ ලියවිලිවල සඳහන් පරිදි ඇදහිල්ලෙන් දේව සබඳතාවට පැමිණි අය ජීවනය අත්කර ගනිති. (රෝම1:17) ජාතික ධර්මසේවා සභාව ප්‍රකාශනය වූ "දහම් අරුණෝදයක් කරා" ප්‍රකාශනය විධායක ලේකම් ගරු වින්ස්ටන් ප්‍රනාන්දු පියතුමා (දි.ස. නිකාය) වර්තමාන බදුල්ල පදවි රදගුරු තුමා.**

සභාවේ පරිපාලනයේ විවිධ විෂය පිළිබඳ නොයෙක් වාද විවාද, තීන්දු තීරණ, නිගමන රාශියක් ජනගත වී ඇත. හඳුනාගෙන නැත. දේව ජීවිත ක්‍රියාත්මක නොවන කිතුනු ජීවිත තුළ සැබෑ කිතු දහම ගොඩ නගන්නේ කෙසේද? "බෙදා හදා ගැනීමේ නවෝදයක් කරා" සමුළුවේ නිර්දේශ වූ කරුණු කාරණ සැබෑ ලෙසම ක්‍රියාත්මක නොවූයේ මන්ද?

දෙවන වතිකාන මණ්ත්‍රණ සභාවේ දේව අනාවරණය පිළිබඳව 6 වන පරිච්ඡේදයෙහි සභා ජීවිතය තුළ ශුද්ධ ලියවිල්ලේ කාර්ය භාරය පැහැදිලි කර දී ඇත. එයින් අනුභාවය ලද හා ඒ ඉගැන්වීම පාදක කරගත් 1968-1969 ජාතික කතිකාවත ශ්‍රී ලංකාවේ සභා ක්‍රියාකාරිත්වය තුළ ශුද්ධ ලියවිල්ලට හිමි තැන පිළිබඳව වැඩි අවධානයක් යොමු කොට ඇතත් පසුගිය විසිපස් වසර තුළ ඇතිවී තිබෙන ප්‍රගතිය පිළිබඳව අපට සෑහීමකට පත්විය නොහැකිය.

දෙවන වතිකාන මණ්ත්‍රණ සභාවට පසුව ශ්‍රී ලංකාවේ බිහිවූ ප්‍රතිසංස්කරණ සංවිධාන දේව වචනය හා ශුද්ධාත්ම බලය සිය ආධ්‍යාත්මිකතාවයේ පදනම වශයෙන් භාවිත කරයි. කෙසේ වුවද කිතුනු බැතිමතුන්ගෙන් ගොනු කරගෙන ඇති දත්ත අනුව පෙනී යන්නේ දේව වචනය අප කතෝලිකයන් වෙත ගෙන ඒම සඳහා තව බොහෝ දුර යා යුතු බවයි. තවමත් බයිබලය හෝ අඩු තරමින් නව ගිවිසුමවත් නොමැති පවුල් බොහෝය. තමන් ළඟ ඇතත් සමහරු ඒවා කියවා නැත. දේව වචනය පිළිබඳ ගැඹුරු දැනුමක් නැති බැවින් බොහෝ කතෝලිකයෝ නොමඟ යති. බයිබලය දන්නා බව පෙන්වමින් බයිබලය කේන්ද්‍ර කොටගත් කිතු දහමක් ඉදිරිපත් කරන විවිධ මූලධර්මවාදීන්ගේ ග්‍රහණයට මොවුහු හසුවෙති.

මූලධර්මවාදීහු තම යැදුම් සහ ගීතිකා සඳහා බොහෝ දුරට දේව වචනය උපයෝගී කර ගනිති. ඔවුහු  බයිබල් පාඨමාලා හා අධ්‍යාපන සැසිවාර නොකඩවා පවත්වාගෙන යති. මෙලෙස විවිධාකාර ක්‍රියාමාර්ග වලින් දේව වචනය ජනප්‍රිය කිරීමට උත්සාහ ගනිති.

දැනට එකතු කරගෙන ඇති දත්ත අනුව පෙනී යන්නේ බයිබලය ගැන වඩා හොඳ දැනුමක් ලබා ගැනීමේ බලවත් ආශාවක් බොහෝ දෙනකු තුළ ඇතත්, ඊට සුදුසු අවස්ථා හා අවකාශ නොමැති වීම හා පූජක තුමන්ලා විසින් දේව වචනය නිදහස්ව බෙදා ගැනීමට දක්වන මැලිකම නිසා ඔවුන් කලකිරීමට පත්ව ඇති බවය. දිව්‍ය පූජාවේ දී හා ප්‍රසාද නිධාන ලැබීමේ දී දේව වාක්‍ය පිළිවෙතින් උපරිම ඵල නෙලා ගැනීමක් සිදු නොවේ. දේව වචනය පදනම් කරගෙන පැවැත්විය යුතු දේශනයද නිසි සූදානමකින් තොරව ඇතැම් අවස්ථාවල සිදුවන බැවින් එය අසාර්ථකත්වයට හේතු  වී ඇත. කිසිම ආගමික නිකායකට නොවන්නා වූ බයිබල් සමාගම කතෝලික සහා පාලකයන්ගෙන් ප්‍රමාණවත් අනුග්‍රහයක් හෝ සහයෝගයක් නොලබයි. මේ අනුව

28 වන පිටුවට.....

# “නිදහසේ” සැබෑ අරුත සොයා යන්නට...... !

‘නිදහස’ යන වදන හා බැඳි විවිධ නිර්වචන අපට අසන්නට ලැබේ. කෙනෙක් දේශපාලන නිදහස ගැන ද, කෙනෙක් ආර්ථික නිදහස ගැන ද කතා කරති. පෞද්ගලික හා පවුල් ජීවිත තුළ නිදහසක් නොමැති බැව් කියමින්, සිතමින් ළතැවෙන්නෝද අඩුවක් නැත. සැබැවින් ම නිදහස යන්න එක් කරුණකට දෙකකට ලඝුකොට තැබිය හැක්කක් නොවන බවම යි සත්‍යය. ජීවිත අභියෝග රැසකින් පීඩිත වුවකු ‘නිදහසේ හුස්ම ගන්නවත් බැරිවයි දැන් ඉන්නේ’ යනුවෙන් කරන ප්‍රකාශය තුළින් ගම්‍ය වන්නේ ද නිදහසේ යථාර්ථය ම නොවන්නේ ද?

හුස්ම ! පරිසරය - සොබාදහම ලෝ සත වෙත නොමසුරුව තිළිණ කොට දී ඇති මේ හමායන සුළඟ අපේ ජීවනාලියේ ප්‍රබලම සාධකය යි. හුස්ම ගන්නා බැව් අමතක කරනට තරම් මානව ක්‍රියාකාරකම් අදුරදර්ශී වීම අභාග්‍යයක්මයි. එහි ආදීනව සුළඟට පවා දරාගන්නට බැරි තරම් වීම ආත්මාර්ථකාමීත්වයේ මිස නිදහසේ වරදක් නොවේ. ආත්මාර්ථකාමීත්වය හා පටු චින්තනය විසින් සොයා නොබලා මුදා හරින වායුධාරා - ධූම ධාරා නිදහසේ ගලා යද්දී, සුළඟ වළක්වා ලන්නට මුකවාඩම් බැඳ ගැනීමට තරම් දුර දිග ගොස් තිබීම අවාසනාවකි.

ගෘහශ්‍රිතව ද, මඟ තොටේ දී ද, කම්මල් හා කාර්යාල ආශ්‍රිතව ද ගොඩ ගසා ඇති කසළ ගොඩවල් කියා පාන්නේද තම නිදහස මිස සමාජ සත්ත්වයාගේ නිදහස ගණන් නොගන්නා බවක් ම නොවේ ද? මේ පටු සිතිවිල්ලේ උච්චතමය “කුණු කඳු” නිර්මාණය වීම හා ඒවා නාය යාමෙන් මිනිස් ජීවිත උඩු යටිකුරු කරන සමාජ ඛේදවාචකයක් සිදු වීම නොවන්නේ ද? සොබා දහම ජීවත් වීමට ඉඩ සලස්වා තිබිය දී තමකමටම ඇලී ගිය පැවතුම් සොබා දහමේ විස්මිතම නිමැවුම වූ ජල සම්පත කෙරෙහි ද දක්වන්නේ අකාරුණික අයුරින් බව විමසිලි නෙත් වලට පෙනේ. දියුණුව - සංවර්ධනය මුවාවෙන් අවිද්‍යාව නැතිනම් හොඳින් සිතා මතා කටයුතු නොකිරීම හා අනාගත මානව පැවැත්ම නොතකන ප්‍රජාව ජලයට මුසු කරනුයේ වස විෂ යි. කුණු - කැළි කසළයි. මේ එකිනෙකට එහා ගිය තවත් බොහෝ අකාරුණිකකම් පරිසරයට සිදු කරමින් නිදහස ගැන වැදි බණ දෙසීමෙන් ඵලක් වේද ?

මේ සියල්ල අතර දෝලනය වන ‘කිතුනු ජීවිත භූමිකා’ තුළ නිදහස අරුත් ගැන්විය යුත්තේ - අරුත් ගන්වන්නේ කෙලෙසින් ද? කිතු සමිඳුන්ගේ මෙලොව මාංසගතවීම, ජීවන චාරිකාව හා කුරුසියේ දිවි පිදුම තුළ ලොවට විමුක්තිය උදා කළ බව අපේ පරම කිතුනු විශ්වාසයයි. ‘නිදහස’ උදා වී තිබිය දී නිදහස සොයා යන්නට වී ඇත්තේ ඇයි ? කිතු සමිඳුන් ජීවිත පූජාවෙන් අත්කර දුන් විමුක්තියේ මඟ අපට වැරදී ඇත. කිතු දහම ආත්මගත නොවීම හෙවත් පාපයේ අඳුරට යොමු වීම කිතුනුකම තුළ නිදහස ඇහිරී යාමේ ප්‍රවණතාවයි. පාපය නම් වූ තෙඅකුරු තුළින් ගම්‍ය වන මහ තේරුම අපේ නිදහස වළලා දමන්නට මෙන්ම අනුන්ගේ නිදහස නැති කරන්නට ද මං හදා තිබේ. දේව මැවිල්ල දෙස ආදරණීය හදකින් හා මෛත්‍රී කරුණා මුසු දෙනෙතින් බලන සඳ ‘නිදහස’ සුවයක්ම ගෙන දෙනු ඇත.

ආදර්ශවත් කිතුනුකම විමුක්ති අරගලයක යෙදිය යුත්තේ අන් කවරක් සමඟවත් නොව තම හෘදය සාක්ෂිය සමඟම යි. නැතිනම් ශුද්ධාත්ම හඬින් ප්‍රමුදිතව එහඬින් සංවේදීව මැවිල්ල දෙස බලා කටයුතු කිරිම යි. මැවිල්ලට පෙම් කිරීම යි.

**නීටා. අයි. ප්‍රනාන්දු, කඳාන**

27 වන පිටුවෙන්.....

බයිබල් දූත සේවාව පිළිබඳව 1968-1969 ජාතික කතිකා ප්‍රකාශනයන් නිශ්ඵල ලියවිලි බවට පත්ව තිබේ. ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුලු සුදතුම් පියාණන් නිතර ප්‍රකාශ කළ පරිදි බයිබල් සේවාව සියළු කිතුනුවන් එක්සේසත් කිරීමේ ක්ෂේත්‍රයක් විය යුතුය.

ජේසුස් ක්‍රිස්තුස් වහන්සේම තම ශ්‍රාවකයනට සුබාරංචිය ප්‍රකාශ කිරීමට දුන් නියෝගය **“ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ කෙරෙහි පැමිණි කල ඔබ බලය ලබන්නාහුය. එවිට ඔබ ජෙරුසලමෙහිද, මුළු ජුදයෙහි හා සමාරියෙහිද, පොළොවෙහි සීමාන්තරයන් දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නාහුය” (ක්‍රියා 1.8, මතෙව් 28.18, මා ක් 16.15).**

**ජෝ. සංගපාල ආරච්චි, පමුණුගම**

“දහම් අරුණෝදයක් කරා”

1995 ජාතික ධර්මසේවා සමුළුව (ග්‍රන්ථය ඇසුරෙනි)

# කතෝලික ධර්මය
## අ.පො.ස ( සා/පෙළ ) විභාගය - 2020
## ආදර්ශ ප්‍රශ්න පත්‍රය - I කොටස

**නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. "ජේසු නසරේනු ජුදයන්ගේ රජ" මෙම නාමයෙහි කෙටි යෙදුම වන්නේ,
    i. IRNI ii. INRI iii. IMRJ iv. IRNI

02. අරමතියාවේ ජෝසෙප් විසින් භූමදාන කරන ලද්දේ කාගේ මෘත ශරීරයද?
    i. ජුදාස්ගේ ii. ස්නාවක ජුවාම් තුමාගේ
    iii. ක්‍රිස්තුන් වහන්සේගේ iv. පේදුරු තුමාගේ

03. "මාගේ ස්වාමිනි මාගේ දෙවියනි" යන වගන්තිය උච්චාරණය කර විශ්වාසය ප්‍රබල ලෙස ප්‍රකාශ කල තැනැත්තා කව්ද?
    i. තෝමස් තුමා ii. පේදුරු තුමා
    iii. ජුවාම් තුමා iv. ජාකොබ් තුමා

04. පෙන්තකොස්ත දිනය උපන් මංගල්‍යය වන්නේ කාගේද?
    i. පෙන්තකොස්ත සභාවේ ii. ස්නාවක ජුවාම් තුමාගේ
    iii. පේදුරු තුමාගේ iv. ශුද්ධවූ සභාවේ

05. ශුද්ධවූ මහ ජාකොබ් තුමන් හඳුන්වන තවත් නාමයකි.
    i. කයිතානු මුනිතුමා ii. සන්තියාගෝ මුනිතුමා
    iii. අගුස්තීනු මුනිතුමා iv. රෝගුස් මුනිතුමා

06. ගමාලියෙල් ගුරුතුමාගෙන් අධ්‍යාපනය ලැබුවේ කව්රුන්ද?
    i. ශුද්ධවූ පාවුලු තුමා ii. ශුද්ධවූ පේදුරු තුමා
    iii. ශුද්ධවූ ඇන්ඩෘ තුමා iv. ශුද්ධවූ ස්නාවක ජුවාම් තුමා

07. ක්‍රිස්ටෝපර් වාස් සහ මරියා මිරැන්ඩා යනු කාගේ දෙමව්පියෝද?
    i. ක්‍රිස්ටෝපර් වාස් තුමාගේ ii. මරියා ගොරෙත්ති තුමියගේ
    iii. ඇග්නස් තුමියගේ iv. ජුසේවාස් තුමාගේ

08. ශුද්ධවූ මහා ජාකොබ් තුමාගේ හිස ගසා දැමුවේ කවුද?
    i. පිලාත් ii. හෙරෝද්
    iii. කයිපාස් iv. හෙතිපර්

09. "චර්මච්ඡේදනය" දෙවියන් වහන්සේ විසින් කා සමඟ ඇතිකර ගත් ගිවිසුමේ බාහිර සලකුණද?
    i. නෝවා iii. ඊසාක්
    ii. ආබ්‍රහම් iv. ජාකොබ්

10. [ ]
    සාමාන්‍ය ජනතාව | අයකැමියෝ | සෙබළු

    හිස්තැනට සුදුසු පිළිතුර තෝරන්න.
    i. ක්‍රි. ව. දේශනාකල පාර්ශව ii. ජුවාම් තුමා දේශනාකල පාර්ශව
    iii. ස්නාවක ජුවාම්තුමා දේශනාකල පාර්ශව iv. පේදුරුතුමා දේශනාකල පාර්ශව

11. ශුද්ධවූ සභා මාතාව ජනවන්දනා වසරේ මනස්තාපයේ කාලය ලෙස නම් කර ඇත්තේ කුමන කාලයද?
    i. නත්තල් / සාමාන්‍ය සමය ii. ආගමන කාලය / පාස්කු සමය
    iii. සාමාන්‍ය සමය / චතාරික සමය iv. ආගමන කාලය / චතාරික කාලය


12. ජේසුස් වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතය ආරම්භ වන්නේ කුමකින්ද?
   i. කන්ද උඩ දේශනාවෙන්   ii. බව්තීස්ම ස්නාපනයෙන්
   iii. කානානුවර මගුල් ගෙදරදී   iv. අංශ භාග රෝගියා සුව කිරීමෙන්

13. ප්‍රාතිහාර්ය ප්‍රධාන වශයෙන් කොටස් කීයකට බෙදිය හැකිද?
   i. 4 කි.   ii. 2 කි.
   iii. 3 කි.   iv. 6 කි

14. ජේසුස් වහන්සේගේ වචනය හා ක්‍රියාවන්ගේ හරය වූයේ කුමක්ද?
   i. උන්වහන්සේගේ බලය පෙන්වීමයි   ii. ප්‍රාතිහාර්ය කිරීමේ බලය පෙන්වීමයි
   iii. දේව රාජ්‍යයේ උදාවයි   iv. මිනිස් බලය පෙන්වීමයි

15. "මා මෙය දැන ගත්තේ කෙසේද? මම මහල්ලෙක්මි. මාගේ භාර්යාවද වයස් ගතව සිටී." මෙය ප්‍රකාශ කරන ලද්දේ කවුරුන්ද?
   i. ජුසේ තුමා   ii. සකේවුස් තුමා
   iii. ජොහාන් තුමා   iv. සකරියෙස් තුමා

16. එඬේරික ජීවිතයක් ගත කල ඊශ්‍රායෙල් ජනතාව දේව ජනතාවක් බවට පත් වන්නේ කුමක් මඟින්ද?
   i. ප්‍රසාද ස්නාපනය මඟින්   ii. සීනායි ගිවිසුම මඟින්
   iii. චර්මඡේදනය මඟින්   iv. නික්මයාම ගමන මඟින්

17. 


   හිස්තැනට සුදුසු පිළිතුර තෝරන්න.
   i. මිනිසාගේ බල මහිමය   ii. මිනිසාගේ උතුම්කම
   iii. දේව බලය   iv. මිනිසාගේ බලය බෙදෙන කොටස් 3කි.

18. හමුදා භටයකුට සමාන වන්නේ කවුරුන්ද?
   i. ප්‍රසාද ස්නාපනය ලැබූ අයකු   ii. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූ අයකු
   iii. පූජකවරය ලැබූ අයකු   iv. ශුද්ධාත්ම වරම් ලැබූ අයකු

19. රෝම පුරවැසි භාවය පදනම් කරගෙන රෝම අධිරාජ්‍යයාගේ විනිශ්චය ඉල්ලුවේ කවුද?
   i. ශුද්ධවූ පාවුලු තුමා   ii. ශුද්ධවූ පේදුරු තුමා
   iii. ශුද්ධවූ අන්තෝනි තුමා   iv. ශුද්ධවූ ෆ්‍රැන්සිස් තුමා

20. අන්‍ය ජාතීන්ගේ අපෝස්තුලුවරයා යන ගෞරව නාමය ලැබුනේ කාටද?
   i. පේදුරු තුමාට   ii. මාක් තුමාට
   iii. ජොහාන් තුමාට   iv. පාවුලු තුමාට

---

**පිළිතුරු :**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1. ii | 4. iv | 7. iv | 10. iv | 13. i | 16. ii | 19. i |
| 2. iii | 5. ii | 8. ii | 11. ii | 14. iii | 17. ii | 20. iv |
| 3. i | 6. i | 9. iii | 12. ii | 15. iv | 18. iv | |

---

**වැරැද්ද සැදීමයි - ජනවාරි කලාපය - 2020**

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) කතෝලික ධර්මය 2020 ආදර්ශ කෙටි ප්‍රශ්න පත්‍රය -
ප්‍රශ්න අංක 2 (i) - පළවූ පිළිතුර : අළු බදාදා සිට පාස්කු ඉරිදා (x)
නිවැරදි පිළිතුර : ගොබ් ඉරිදා සිට ආලේලූයියා සෙනසුරාදා (√)
(වරදක් සිදුව ඇත. අපගේ කණගාටුව)

---

**ඉදිරිපත් කිරීම :- ජේ. ඒ. එල්. එම්. ශ්‍රීමතී සිල්වා මෙනවිය.**
ආචාරිනී : මිනුවන්ගොඩ / ශ්‍රී ඥානෝදය ම.ම.වි. දිවුලපිටිය.

# ලක්දිව ක්‍රිස්තු ශාසනය ( VII )
## අ.පො.ස. (උ.පෙ.) ක්‍රිස්තියානි ධර්මය ශිෂ්ටාචාරය සඳහා අත්වැලකි.
## ඕලන්ද පාලන සමය

**වාස් පියතුමන්ගේ ප්‍රාතිහාර්ය**

වාස් පියතුමන්ගේ ගැඹුරු ඇදහිල්ල හා විශ්වාසය කරණකොටගෙන ලක්දිව සිදු කෙරුණු ප්‍රාතිහාර්ය බොහෝය. ■ දෙවන විමලධර්මසූරිය රජ සමයේ මහනුවර පැවති දැඩි නියං සමය දුරු කරමින් රාජධානිය පුරා මහා වැසි වැස්සවීම ■ යාච්ඤා කරමින් සිටින විට එක් අවස්ථාවකදී දිව්‍ය බලයෙන් සුළු කාලයකට ඉහළට ඔසවා ගැනීම. ■ වාස් පියතුමා සොයා පැමිණි ලන්දේසි හේවායන්ට දේව මාතාවන් වහන්සේ දර්ශනය වීම. ■ මහනුවර සිරකරුවකු ලෙස සිටියදී ධර්මදූත කටයුතු සඳහා කිසි කෙනකු නොදැක මහවැලි ගඟින් එගොඩ වීම. ■ තනි අලියකු මෙල්ල කිරීම. ■ පා ගමනින් දැදුරු ඔය තරණය කිරීම. ■ වන සතුන්ගෙන් රැකවරණය පතා ගල්ගමුවේහි සිටවූ කරුවල ලී කුරුසියෙන් සර්ප විෂ විනාශ වී සුවපත් වීම.

**වාස් පියතුමන්ගේ ධර්මදූත ප්‍රතිපත්ති**

ජුසේ වාස් පියතුමාගේ ධර්මදූත ප්‍රතිපත්ති සර්ව භෞමිකය. ඉතා ඍජු හා නිහතමානිය. ■ එතුමා රාජ්‍ය දේශපාලනයට සම්බන්ධ වූයේ නැත. නිදහස් මත දරන්නකු ලෙස අපක්ෂපාතීව ධර්ම ප්‍රචාරක කටයුතු කර ගෙන ගොස් ඇත. ■ කිතුනු නොකිතුනු හැම දෙනාටම එකම ලෙස දයා සේවාව දක්වන ලද්දේ ආගමික භේදයකින් තොරව වීම. ■ දේශීය සංස්කෘතිය, සිංහල හා දෙමළ භාෂා මනාව ඉගෙන ගත් පියතුමා අන් ධර්මදූත වරුන්ට ද දේශීය භාෂාවෙන් ඉගැන්වීය. ■ ජනවන්දනාව සඳහා දේශීය බසින් යාච්ඤා හා ගායනා උගන්වා ඇත. ■ යුරෝපයේ ධර්මදූත වරුන් මෙන්ම ආසියානු ධර්මදූත වරුන්ට ද සාර්ථකව මිෂනාරි කටයුතු කිරීමට හැකි බව එතුමන් විසින් මනාව පෙන්වා දී ඇත. ■ එතුමාගේ සරල අල්පේච්ඡ ජීවිත පැවැත්ම සියලු දෙනා හට ආදර්ශයක් විය. ■ ඉහළ තනතුරු හා නම්බු නාම එතුමා ප්‍රතික්ෂේප කළේය. ■ ලක්දිව පිහිටු වන ලද කිතුනු සංඝ සඳහා ගිහි නායකයන් පත් කිරීම යනාදිය එතුමාගේ ධර්මදූත ප්‍රත්පත්ති ලෙස පෙන්වා දිය හැකිය.

**ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා**

| | | |
|---|---|---|
| උපත | - | 1676.06.08<br>ගෝව දිවාරි නම් ප්‍රදේශය |
| පූජකවරය ලැබීම | - | 1695 |
| ඔරිතෝරියානු පැවිදි නිකාය සමඟ සම්බන්ධ වීම | - | ක්‍රි.ව. 1700 |
| ලක්දිව කිතු සසුනේ සේවයට පැමිණීම | - | ක්‍රි.ව. 1705 |
| සිංහල භාෂාව ඉගෙන ගැනීම ආරම්භ කිරීම | - | ක්‍රි.ව. 1710 |
| ලක්දිව අනු නායක ලෙස තෝරාපත් කර ගැනීම | - | ක්‍රි.ව. 1724 |
| බෝලවත්ත ග්‍රාමයේ නේවාසිකව සිටිමින් ග්‍රන්ථකරණයට දායක වීම | - | 1730-1740 |
| බෝලවත්ත ග්‍රාමයේදී ස්වර්ගස්ථ වීම | - | 1742.07.17 |

**ගොන්සාල්වේස් පියතුමාගේ දූත මෙහෙවර**

ජුසේ වාස් පියතුමා ස්වර්ගස්ථ වූ පසු ලක්දිව කිතු සසුනේ මූලිකත්වය ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමාට ලැබිණ. එතුමා දක්ෂ ලේඛකයකු මෙන්ම කලා ශිල්පියෙක් ද විය. එතුමා තම මව් බස වූ කොන්කානි බසට අමතරව ලතින්, පෘතුගීසි, ස්පාඤ්ඤ, සිංහල හා දෙමළ යන භාෂා දැන උගත්තේය. මේ යුගයේදී ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමාට ජය ගැනීමට සිදු වූ අභියෝග 2 කි.

එනම් උඩරට රජු නායක්කාර්වරුන් වීම නිසා ඔවුන් බෞද්ධ බලවේග වලට පක්ෂපාත වීමය. අනෙක ඕලන්ද වරුන් අදහස් කළේ ඉන්දීය කතෝලික මිෂනාරිවරුන් පෘතුගීසි ඔත්තුකරුවන් ලෙසය. එතුමා ක්‍රි.ව. 1710 දී යාපනය හා පුත්තලම ප්‍රදේශයේ 1000 ක් පමණ දෙනාට බව්තිස්මය ලබා දී ඇත. මාර්ග දුෂ්කරතා, සතුරු උවදුරු යන මේ සියලු කාරණා ජය ගනිමින් ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමාගෙන් සුවිශේෂී ධර්මදූත සේවාවක් ලක්දිවට සිදුවී ඇත.

**ගොන්සාල්වේස් පියතුමාගේ සමාජ මෙහෙවර**

එතුමා සිංහල සාහිත්‍යයට සුවිශාල සේවාවක් කර ඇත. කිතු දහම ජනතාවට පහදා දීමේදී දේශයේ පවතින අනෙක් ආගම් කෙරෙහිද තම අවධානය යොමු කොට පොතපත රචනා කළේය. ඒ රචනා අතර ගද්‍ය, පද්‍ය යන දෙකොටසට අයත් කෘති වේ. මුද්‍රණ යන්ත්‍රය ලක්දිව නොතිබූ අවධියේ මේ පොත් රචනා කොට ඇත්තේ අත්පිටපත් කිරීමෙනි. ඒ සඳහා කිතුනුවන් කිහිප දෙනෙකුගේ උදව් එතුමා ලබා ගෙන ඇත. එතුමන් විසින් සිංහල බසින් පොත් 21 ක් ද දෙමළ බසින් පොත් 15 ක් ද පෘතුගීසි බසින් පොත් 4 ක් ද ලන්දේසි බසින් පොත් 1 ක් ද වශයෙන් රචනා කොට ඇත. එතුමා සංගීතඥයෙකි. ගැඹුරු දේව ධර්ම ශාස්ත්‍රයකින් කිතුනු බැති ගී රැසක් ලියා ඇත. ඒ සඳහා සංස්කෘත වචන ඇතැම් විට භාවිත කර ඇත. එමෙන්ම සිංහල පාස්කු නාට්‍ය කලාවේ ද පසන් ගායනයේ හා කැරොල් ගායනයේ ද මුල් පියවර තැබුවේ මෙතුමාය. උගතුන් සඳහා ගැඹුරු බසකින්ද සාමාන්‍ය ජනතාවට සරල බසකින්ද කිරීමට පියතුමා වග බලාගෙන ඇත. එතුමා විසින් රචිත ප්‍රධාන ග්‍රන්ථ කිහිපයකි. එනම් 1. දේව වේද පුරාණය 2. සුවිශේෂී විසර්ජනය 3. ඥානාංජනය 4. සුකෘත දර්පනය 5. අඥාන ඖෂධය 6. වේද කාව්‍යය 7. පසන් පොත 8. මංගල ගීතය 9. ආනන්ද කලිප්පුව 10. දුක්ප්‍රාප්ති ප්‍රසංගය ඒ පියතුමා දෙමළ බසින් ද රචිත පොත් කිහිපයකි. එනම්, 1. අරුල්වේද පුරාණම් 2. සුවිශේෂී විරිත්තුරෙයි 3. වියාකුල පිරසිංගම් යනාදිය ප්‍රධාන වේ.

**ගොන්සාල්වේස් පියතුමන් ධර්මදූත ප්‍රතිපත්ති**

- සියලුම ඔරතෝරියානු පියවරුන්ට ලැබෙන පරිත්‍යාග පොදු අරමුදලකට එකතු කර අවශ්‍යතාව අනුව වියදම් පියවා ගැනීම.
- ධනය කෙරෙහි ආශාව නැති කර අල්පේච්ඡතාව අනුගමනය කිරීම.
- හැම ගමකටම පූජක සේවාව ලබාදීම වෙනුවෙන් පියතුමන්ලා ස්ථාන මාරු කිරීම.
- උඩරට නරේන්ද්‍රසිංහ රජු සමග සුහද සම්බන්ධතා ගොඩනගා ගැනීම, දේශපාලනයට දායක නොවීම සහ දේවස්ථානවල කටයුතු සඳහා ස්වදේශිකයන් පුහුණු කිරීම.

**සටහන - එස්. හේමාල් පෙරේරා**



# හදබැතින් තුති පුදමු ශ්‍රී ලංකා අප ස්වාමි දූ මෑණියනී, ශුද්ධ වූ ජපමාලය ලොව බලවත්ම යැදුමකි

දිනපතා ශුද්ධ වූ ජපමාලය උච්චාරණය කිරීමෙන් හා ශුද්ධවූ ජපමාලය තම සන්තකයේ තබා ගැනීමෙන් අසීමිත වරප්‍රසාද මරිය මව්ගෙන් ලබාගත හැක.

නපුරාට එරෙහිව ඇති ප්‍රබලම අවිය ශුද්ධ වූ ජපමාලය වේ.

සෑම ශුද්ධවූ දිව්‍ය පූජාවකට පසුව පෙර එක් නමෝ මරියක් අපි සෑම තනිව උච්චාරණය කරමු.


ශුද්ධ වූ ජපමාලය උච්චාරණයෙන් අපට ලබාගත හැකි වරප්‍රසාදයන්ගෙන් බිඳක්

* නපුරාගෙන් ජයගැනීමට ශක්තිය,
* තම පව්වලට වන්දි ගෙවීමක් සඳහා ප්‍රවේශයක්,
* ශුද්ධගිනිස්ථානයේ ආත්ම ගැලවීමට,
* තම මරණයට ප්‍රථම ප්‍රසාද නිධාන ලබාගැනීමට හැකිවීම,
* මානසික ආත්මික සැනසීම,
* ස්වර්ග ජීවිතය ලබාගැනීමට, යන ආදී වේ.

දිනපතා ජපමාලය හෝ අවම වශයෙන් එක් නමෝ මරියක් කීමට උත්සහ කරමු.

නව ගමනකට පියවර තබන භක්ති ප්‍රබොධනයට සුබාශිංසන පතමු 2020 වසරේ.

**ඇන්තනි පවුලේ සැම**





"භක්ති ප්‍රබෝධනය" සංස්කාරක ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා විසින් කොළඹ කතෝලික මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.
පුවත් පතක් ලෙස තැපැල් හලේ ලියාපදිංචි කර ඇත. Q/D/03/පුවත්/2020